කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2021



බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசனம், மத மற்றும் கலாச்சார அலுவல்கள் அமைச்சு

Ministry of Buddhasasana, Religious & Cultural Affairs



කාර්යසාධන වාර්තාව

2021

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,

කොළඹ 07

දුරකථන : 011- 2307694
011- 2307674
ෆැක්ස් : 011- 2307688
011- 2300513
විද්‍යුත් තැපෑල : info@mbs.gov.lk
වෙබ් අඩවිය : http://www.mbs.gov.lk

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය

අන්තර්ගතය		**පිටු අංක**
පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01-06
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	07-26
පරිච්ඡේදය 03	- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	27-71
පරිච්ඡේදය 04	- කාර්ය සාධන දර්ශක	72
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	73-74
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ	75-76
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව	77-88

සංස්කෘතික කටයුතු අංශය

පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	89-97
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	98-111
පරිච්ඡේදය 03	- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	112-136
පරිච්ඡේදය 04	- කාර්ය සාධන දර්ශක	137-138
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	139-142
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ	143-145
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව	146-156
ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය		157 -167

බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් බවට පත්ව ඇති අතර අනෙකුත් සෑම ආගමකටම සමානාත්මතාවයෙන් සැළකීම සහ සියළු ආගම් හා ජනවාර්ගික කොටස් සමග සහජීවනයෙන් ජීවත් විය හැකි ආකාරයේ සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමත් බෞද්ධ සාරධර්ම මත පදනම් වූ තිරසර ආර්ථිකයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමත් මෙම අමාත්‍යාංශයේ කාර්යභාරයේ සුවිශේෂ වූ කොටසකි.

මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා පූජනීය ස්ථාන සංවර්ධනය, පූජ්‍ය පක්ෂයේ අභිවෘද්ධිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආගම් හා ජාතීන් අතර සහජීවනය ඇතිකිරීම වෙනුවෙන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් හා මෙරට ක්‍රියාත්මක වෙනත් ආගම් වලට අදාලව කටයුතු කිරීම මෙම අමාත්‍යාංශ විෂයය පථය යටතේ බුද්ධශාසන, ආගමික අංශය මගින් සිදුවේ.

ඒ අනුව 2021 වසර තුළ අමාත්‍යාංශ කාර්යයන් අතුරින් බුද්ධශාසන , ආගමික කටයුතු අංශ වල කාර්යයන්ට අදාළව, හා සංස්කෘතික කටයුතු අංශයේ කාර්යයන්ට අදාළව මෙම කාර්ය සාධන වාර්තාව සකස් කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසර ලෙස සංවර්ධනය වූ ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

බුදු දහම ප්‍රමුඛව සියලු ආගමික ඉගැන්වීම මත පදනම්ව සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කරගනිමින් ගුණ ගරුක, විනය ගරුක හා අධ්‍යාත්මික සංවර්ධනයෙන් යුත් ආගමික සහජීවනයෙන් පිරි සමාජයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

අරමුණු

ආධ්‍යාත්මික වශයෙන් පිරිපුන් ගුණගරුක සමාජයක් බිහි කිරීම සඳහා බුදු දහමට ප්‍රමුඛස්ථානයක් ලබා දෙමින් හින්දු, කිතුණු හා ඉස්ලාම් ආගම් සමඟ සහජීවනයෙන් කටයුතු කිරීම සඳහා

- බුද්ධශාසනයට ප්‍රමුඛස්ථානය දෙමින් එය සුරක්ෂිත කොට පෝෂණය කිරීම.
- සෑම ආගමකටම පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂාකර දෙමින් සියලු ආගමික හා ජනවාර්ගික කොටස් සමඟ අන්‍යෝන්‍ය අවබෝධයෙන් හා සහජීවනයෙන් ජීවත් විය හැකි සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැගීම.
- ථේරවාදී නිර්මල බුදු දහම සුරක්ෂිත කිරීමේ වගකීම හිමි භික්ෂූන් වහන්සේලා බෞද්ධ දර්ශනය මෙන්ම සෙසු භාෂා හා තාක්ෂණික දැනුමෙන් පරිපූර්ණ කිරීම මෙන්ම අනෙකුත් ආගම්වල පූජකතුමන්ලා දැනුමින් ආධ්‍යාත්මික ගුණයන්ගෙන් පරිපූර්ණ කිරීමට කටයුතු කිරීම.
- ඒ ඒ ආගමික සිද්ධස්ථාන කේන්ද්‍ර කර ගනිමින් ජනජීවිතය ආධ්‍යාත්මික හා ආකල්පමය වශයෙන් සංවර්ධනය කරා යොමු කරමින් කුඩාකළ සිටම දූ දරුවන් සදාචාර සම්පන්න පුරවැසියන් බවට පත් කිරීම හා විවිධ ආගම් තුලින් සැබෑ දහම් අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම
- ආගමික සාරධර්ම මත පදනම් වූ ආර්ථිකයක් ගොඩ නැගීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.

- සියලු පුරවැසියන් ආර්ථික හා ආධ්‍යාත්මික සංවර්ධනයෙන් සපිරුණු පුද්ගලයින් බවට පත් කිරීම.
- ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ථේරවාද බුදු දහම ව්‍යාප්ත කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- අවධානයට ලක්නොවී විනාශ වී යන පැරණි බෞද්ධ හා පුරාවිද්‍යාත්මක වටිනාකම් වලින් යුත් ස්ථාන සංරක්ෂණය කොට මතුපරපුරට දායාද කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් විෂය පථයෙන් බුද්ධශාසන හා ආගමික අංශයට හා එම අංශය යටතේ වන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අයත් නීති හා අණපනත් වලට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- බුදුදහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම් කිරීම.
- අනෙකුත් ආගම් සුරක්ෂිතකොට පෝෂණය කිරීම සඳහා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් අමාත්‍යාංශය යටතේ වන අදාළ ආයතන මඟින් ක්‍රියාත්මක කිරීම හා මෙහෙය වීම.
- දහම් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම
- පුජාභූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.
- විනාශවෙමින් පවතින පුරාවිද්‍යාත්මක වටිනාකම් වලින් යුත් ස්ථාන සංරක්ෂණය කොට සංවර්ධනය කිරීම.
- බටහිර ලෝකයට ථේරවාදී නිර්මල බුදු දහම ගෙනයා හැකි ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර හා ධර්මානුකූල ප්‍රතිපත්ති වලින් හෙබි ධර්මදූත සඟරුවනක් බිහිකිරීමට අවශ්‍ය පරිසරය සැකසීම.
- උත්තරීතර අනුශාසක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම.
- අන්තර්ජාතික වශයෙන් ථේරවාද බුදු දහම ප්‍රචාරය කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- නේපාලයේ පිහිටි ශ්‍රී ලංකාවට වෙන් කර දී ඇති ලුම්බිණි පූජා භූමිය සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම.
- සියලු ජන කොටස්වලට තමා කැමති ආගමක් ඇදහීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.
- අනවසර ආගමික ස්ථාන ස්ථාපිත කිරීම වලක්වාලීම.
- මෙම අංශයට අදාල සියලුම ආයතනවල ක්‍රියාකාරිත්වය, නිරීක්ෂණ, මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම, විමර්ශණය කිරීම හා සියලු අධීක්ෂණයන්

1.4 සංවිධාන සටහන - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය- (බුද්ධශාසන හා ආගමික අංශය)



1.5 බුද්ධශාසන හා ආගමික අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
- හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
- මහාභාරකාර දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ පවතින අරමුදල්

- බුද්ධශාසන අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

- ව්‍යාපෘතියේ නම : ශ්‍රී දළදා මාලිගාවට අනුයුක්තව පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු ආයතනයක් ඉදි කිරීම
- දායක නියෝජිත ආයතනය : ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම මත
- ක්‍රියාත්මක බලධාරී ආයතනය : ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
- කොන්ත්‍රාත්කරු : සී /ස ලින්ක් ඉංජිනියරින් පුද්ගලික සමාගම
- ඇස්තමේන්තු ගත වියදම : ඉන්දියානු ආධාර රු.මි. 123.8
  ශ්‍රී ලංකා රජය රු.මි. 21.9
  (වැට් බදු ගෙවීම වෙනුවෙනි) රු.මි. 145.7

2016.09.16 දින සිට 2021.12.31 දිනට ප්‍රගතිය

මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි.)	2020.12.31 දිනට වියදම (රු.මි.)	2021 ප්‍රතිපාදන (රු.මි.)	2021.12.31 දිනට වියදම (රු.මි.)	2021.12.31 දිනට මුළු වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)
123.8	76.26	48.00	34.33	110.59	83%
21.9	6.08	9.30	5.28	11.36	
145.7	82.34	57.30	39.61	121.95	

***2021.12.31 දිනට වියදම දක්වා ඇත්තේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ 2017 වර්ෂයේ සිට මේ දක්වා පවතින ප්‍රගතිය වේ.**

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 වර්ෂ 2021 දී ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන් ප්‍රගතිය (2021.12.31දිනට)

අනු අංකය	වැඩසටහන / ව්‍යාපෘතිය	2021 අයවැය මඟින් ප්‍රතිපාදන ලැබීම් (රු.මි)	අවුරා තබන ලද ප්‍රතිපාදන (රු.මි)	භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	විශේෂ කරුණු
1.	පූජාභූමිවල සංරක්ෂණය සහ සංවර්ධනය	75.0	33.67	97.6	36.58	අතැති බිල්පත් -රු.මි.4.2
2.	ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන	150.0	8.0	97.0	121.26	අතැති බිල්පත් -රු.මි.11.23
3.	ඌණ සංවර්ධිත විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන	250.0	-	95.78	225.23	අතැති බිල්පත් -රු.මි.11.95
4.	තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන	80.0	4.0	68.47	65.86	අතැති බිල්පත් -රු.මි.2.28
5.	ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත පල්ලේකැලේ ප්‍රසාංගික පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම	9.3	1.8	83	5.3	කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වය මත ප්‍රගතිය අවම මට්ටමක පවතී.
6.	විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම	48.076	-	100	43.57	V වන අදියර දක්වා වැඩ අවසන්ව ඇත. ගොඩනැගිල්ල විද්‍යාලංකාර භාරය වෙත පැවරීමට කටයුතු කරමින් පවතී.
7.	භික්ෂු පුහුණු හා ආගමික සහජීවන වැඩසටහන	8.0	1.9	70	3.25	කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් අධ්‍යාපන ආයතන මඟින් පාඨමාලා අවසන් කිරීම ප්‍රමාද වූ අතර ආගමික සහජීවන වැඩසටහන් පැවැත්වීමට ගැටළු ඇතිවිය.
8.	විශ්වකෝෂය අන්තර්ජාලගත කිරීම	6.0	6.0	-	0.0	-
9.	කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම	66.0	-	17	11.72	-

2.1.1 පූජාභූමි සංවර්ධන වැඩසටහන

පූජාභූමි සංවර්ධනය මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරයකි. මේ අනුව බුද්ධශාසන විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව නිශ්චිතව දැක්වෙන පූජනීය ස්ථාන සතු ඉඩම් ප්‍රමාණයන්ගේ විරාත්කාලීන සුරක්ෂිත කිරීම සඳහා එම ප්‍රදේශයන් පූජාභූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සිදුවේ. ආරම්භයේදී පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය කිරීම පිළිබඳ බුද්ධශාසන අමාත්‍යවරයාට තිබූ බලතල ප්‍රකාරව පූජා භූමි ඇති කිරීම සිදුවූ නමුත් 2020 වසරේ අවසාන අමාත්‍ය සංශෝධනයේදී ඒ පිළිබඳ පැහැදිලිව කරුණු ඉදිරිපත් කර නොමැති බැවින්, 1946 අංක 13 දරණ (26 වැනි අධිකාරිය වූ) නගර හා ග්‍රාම සංවර්ධන ආඥාපනතේ 6(2)(ආ) හා 21 (2) (ආ) වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන භූමි පූජාභූමි ලෙස හැදින්වේ. මෙහිලා භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහය ලබා ගනු ලැබේ.

පූජාභූමියක් ලෙස හඳුනා ගැනීමේදී අවධානය යොමු කරන කරුණු

- ආගමික වැදගත්කම
- ඓතිහාසික වැදගත්කම
- පුරාවිද්‍යාත්මක වැදගත්කම
- සංස්කෘතික වැදගත්කම
- ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම
- පාරිසරික වැදගත්කම
- ආර්ථික හා සමාජයීය වැදගත්කම

2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 75 ක් වූ අමාත්‍ය මණ්ඩල තීරණ මත 33.67 ක ප්‍රතිපාදන අවුරා තබන ලද අතර 2021වර්ෂයේ ව්‍යාපෘති සඳහා රු.මි.36.58 ක්වැය කර ඇත.



නාගදීප රජ මහා විහාරයේ විහාර මන්දිරය වැඩි දියුණු කිරීම



නාගදීප රජ මහා විහාරයේ විදේශීය බැතිමතුන් සඳහා වැසිකිලි පද්ධතිය සකස් කිරීම



ඔළබොඩුව රජ මහා විහාරයේ ආරක්ෂිත වැට ඉදිකිරීම



ඔළබොඩුව රජ මහා විහාරයේ ටැම්පිට විහාරය ප්‍රතිසංස්කරණය

2.1.1.1 - රාජ්‍ය වෙසක් උත්සවය -2021

2021 රාජ්‍ය වෙසක් උත්සවය යාපනය දිස්ත්‍රික්කයේ වේලනෙ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඓතිහාසික නාගදීප රජ මහා විහාරයේ පැවැත්වූ අතර, මෙම විහාරස්ථානය ඉදිරියේදී පුජා භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට නියමිතව ඇත. එයට සමගාමීව අප අමාත්‍යාංශය මඟින් විදේශිකයන්ගේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම, අමුත්තන්ගේ වැසිකිලි පද්ධතිය ඉදි කිරීම, විහාර මන්දිරය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම, පැති බැම්ම ඉදිකිරීම, පොත්ගුල් විහාරය, දේව මන්දිරය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම ආදී විහාර භූමියේ අංග සංවර්ධනය කරනු ලැබීය. මේ සඳහා රු.මි 15.72 ක මුදලක් ලබා දුන් නමුත් වැය කර ඇත්තේ 12.73ක මුදලක් පමණි.

2.1.1.2 - 2021 වර්ෂයේ පුජා භූමී ලෙස ප්‍රකාශයට පත් කරන ලද විහාරස්ථාන

- මාම්පිට ගල්ලෙන් රජ මහා විහාරය

2.1.1.3 - රාජ්‍ය පොසොන් උත්සවය

2021 රාජ්‍ය පොසොන් උත්සවය 2021.06.21 දින සිට 2021.06.27 දින දක්වා ‘‘සැම දෙන ලොව සුවපත් වේවා !’’ යන තේමාව යටතේ ඓතිහාසික මිහින්තලය පූජා භූමිය කේන්ද්‍ර කර ගනිමින් වැඩසටහන් පැවැත්වුණි. මෙයට සමඟාමීව මිහින්තලා සති පිරිත් දේශනාව පැවැත් වූ අතර ජාතික රූපවාහිනිය මඟින් මාධ්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.

එහිදී බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් මිහින්තලය පූජා භූමිය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වෙන වැඩ සටහනේ සංවිධාන කටයුතු සිදු කරන ලදී.





2.1.2 ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

දහම් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම මෙම වැඩසටහනේ අරමුණ වේ. 2021 වසරේදී දහම් පාසල් වල සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කල අතර මීට අමතරව දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කිරීමේ ව්‍යාපෘති හා දහම් පාසල් උපකරණ ලබා දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක සිදු කොට ඇත.

2021 වසර සඳහා දිස්ත්‍රික්ක 21 ආවරණය වන පරිදි දහම් පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ ව්‍යාපෘති 301 ක්ද, දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 152 ක්ද, දහම් පාසල් උපකරණ ලබා දීමේ ව්‍යාපෘති 91 ක්ද ආදී ලෙස සමස්ථ ව්‍යාපෘති 544 ක් ක්‍රියාත්මක කොට ඇත. මෙම වැඩසටහන් සඳහා 2021.12.31 දිනට වියදම් රුපියල් මිලියන 121.26 කි. අක් මුදල් ප්‍රමාණවත් නොවීම නිසා රුපියල් මිලියන 11.23 ක් අතැති බිල්පත් වශයෙන් 2022 වර්ෂය සඳහා ගෙවීමට ඉතිරි වී ඇත.



මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී විමල දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම



මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී බෝධිරාජ දහම් පාසලට දහම් පාසැල් උපකරණ ලබා දීම

2.1.3 ඌණ සංවර්ධිත විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

බුදු දහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය උදෙසා කටයුතු කිරීමේදී විහාරස්ථාන වල පවතින භෞතික අඩු පාඩුකම් අවම කිරීමට රාජ්‍ය දායකත්වය ලබාදෙන වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක වේ. මේ යටතේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල වල නිර්දේශය මත සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි හා ජනාධිපති, අගමැති කාර්යාල හරහා ලැබෙන ඉල්ලීම් මෙන්ම ගම සමඟ පිළිසඳරක් වැඩසටහන හරහා යෝජනා වන විහාරස්ථාන වලට අදාළ ඉල්ලීම් පදනම් කර ගනිමින් එකී අවශ්‍යතාවයේ ස්වභාවය හා ශාසනික මෙහෙවර උදෙසා එම විහාරස්ථානය දක්වන දායකත්වය සලකා බලා පහත නිර්ණායකයන් යටතේ කමිටුවක නිර්දේශය මත රජයේ දායකත්වයෙන් සංවර්ධනය කිරීමට උචිත විහාරස්ථාන තෝරා ගැනීම සිදුවේ.

නිර්ණායක

- භූමියේ අයිතිය ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විහාරස්ථානයක් හෝ දසසිල් මාතා ආරාමයක් වීම.
- පසුගිය වසර 02 තුළ වෙනත් ප්‍රභවයකින් ආධාර ලබා නොතිබීම.
- ජල පහසුකම්, විදුලිය හා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැති අවස්ථා වල එම අවශ්‍යතා ඉටු කිරීමට ප්‍රමුඛස්ථානය හිමි වේ.

- විහාරස්ථ භික්ෂූන් වහන්සේලාට/ සිල්මාතාවන්ට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා පවතින ගොඩනැඟිලි තාවකාලික හෝ අර්ධ ස්ථීර තත්ත්වයක් පැවතීම යන කරුණු මත සංඝාවාස සඳහා ආධාර ලබා දේ.
- ප්‍රමාණවත් දාන ශාලාවක් නොමැති අවස්ථා වල දාන ශාලාවක් හා ආගමික වතාවත් ඉටු කිරීමට විහාරගෙය හා ධර්ම ශාලා පහසුකම් සපයා දේ.

2021.12.31 දිනට වියදම රුපියල් මිලියන 225.23 කි. එමගින් දිස්ත්‍රික්ක 24 ක් තුල විහාරස්ථානවලට අදාළ ව්‍යාපෘති 498 ක් සංවර්ධනය කල හැකි විය. අක් මුදල් ප්‍රමාණවත් නොවීම මත රුපියල් මිලියන 11.95 ක් අතැති බිල්පත් වශයෙන් 2022 වර්ෂය සඳහා ගෙවීමට ඉතිරි වී ඇත.



යාපනය තිස්ස විහාරස්ථානයේ සංඝාවාසය ඉදිකිරීම



උඩවැලිවිටිතලාව ශ්‍රී අශෝකාරාම විහාරස්ථානයේ ධර්මශාලාවේ වහළ ප්‍රතිසංස්කරණය



උඩගම ශ්‍රී ශාසනාලංකාර පුරාණ විහාරයේ ආරක්ෂිත පැති බැම්ම ඉදිකිරීම



මුලතිව් වැලිඔය කිරිඉබ්බන්වැව ශ්‍රී ධම්ම ප්‍රනීතාරාම විහාරස්ථානයේ සංඝාවාසය ප්‍රතිසංස්කරණය

2.1.4 තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන

ආධ්‍යාත්මීය වශයෙන් උසස් මනසක් සහිත, සියළු ආකාරයේ හිංසන ක්‍රියාවන්ගෙන් වියුක්ත, මතින් සහ අවසිහියෙන් තොරව නිසි පෝෂණයෙන් සපිරි සෞඛ්‍ය සම්පන්න දිවි පෙවෙතක් ගතකරන, යහපැවැත්මෙන් හා දියුණු පෞරුෂයෙන් හෙබි, දැනුමින් පිරිපුන් මානව සම්පත් සපිරි ගමක් පුණ්‍යග්‍රාමයක් ලෙස හැඳින්විය හැකිය. බෞද්ධාගම සුරක්ෂිත කොට පෝෂණය කරනු වස් අතීත ගමයි පන්සලයි යන සංකල්පය ග්‍රාමීය ප්‍රජාව තුළ ජනිත කිරීම තුළින් යහපත් ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදීමට අවශ්‍යවන්නා වූ බෞද්ධාගමික ඉගැන්වීම් හා එම ක්‍රියාකාරකම් වල යෙදීමට අවශ්‍ය වන්නා වූ දිරිගැන්වීම් ලබාදීම මෙම වැඩසටහන තුළින් සිදු කරනු ලැබේ.

2021 වර්ෂයේ තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන සඳහා රු.මිලි. 80 ක ප්‍රතිපාදන වෙන් වූ අතර, එමගින් දිස්ත්‍රික්ක 22 ක භෞතික සංවර්ධන ව්‍යාපෘති 84 ක් ද සාරධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 1818 ක් ද ක්‍රියාත්මක කරන ලදී. වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන විහාරස්ථාන කේන්ද්‍ර කර ගත් දහම් පාසල් සඳහා පුස්තකාල උපකරණද, එම පුස්තකාල සඳහා දහම් පොත් කට්ටලයක්ද බැගින් ලබාදීම සිදු කරන ලදී.

2021.12.31 දිනට වියදම රු. මිලි. 65.86 ක් වන අතර අක් මුදල් ප්‍රමාණවත් නොවීම මත රු. මිලි 2.28 ක අතැති බිල්පත් 2022 වර්ෂය සඳහා ගෙවීමට ඉතිරි වී ඇත.

2021 වර්ෂයේදී වැඩසටහන සඳහා තෝරාගත් සියළු ගම්මාන වල මෙම වැඩසටහන සිදුකිරීමට සැලසුම් කළද රටතුළ පැවති Covid -19 වසංගත තත්වය මත ජනතාව රැස්කිරීමේ ගැටළු පැවති බැවින්, ගම්මාන කිහිපයක ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සිදු කිරීමට නොහැකි විය.



මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිරි සුමනාරාම විහාරස්ථානයේ පැවති මා පිය උපහාර වැඩසටහන



සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී වනවාසී යෝගාශ්‍රමයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම



තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී විජයසිංහාරාම විහාරස්ථානයේ වෙසක් බැති ගී වැඩසටහන



පුස්තකාල සඳහා දහම් පොත් ලබා දීම

2.1.4.1. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

ආගමික සාරධර්ම මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම හා සියළු පුරවැසියන් ආර්ථික හා ආධ්‍යාත්මික සංවර්ධනයෙන් සපිරුණ පුද්ගලයන් බවට පත් කිරීම මෙම අමාත්‍යාංශයේ අරමුණු අතර වේ. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලැක්වීම මෙම වැඩසටහනේ අරමුණයි. මේ යටතේ 2021 වර්ෂයේදී දිස්ත්‍රික්ක 12ක වැඩසටහන් 20 පැවැත්වීම සඳහා රු.මි.0.62 ක් නිදහස් කර ඇත. කොවිඩ් 19 වසංගත තත්වය මත ජනතාව රැස් කිරීමේ ගැටළු පැවැති බැවින් දිස්ත්‍රික්ක කිහිපයක පමණක් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2021 වසර තුල ක්‍රියාත්මක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

අනු අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන් ගණන	වියදම (රු.)
1	කෑගල්ල	2	69,000.00
2	මාතර	1	48,360.00
3	නුවරඑළිය	1	25,000.00
4	හම්බන්තොට	1	66,000.00
5	කුරුණෑගල	3	102,100.00
6	මාතලේ	1	25,000.00
7	කොළඹ	1	19,000.00
8	අනුරාධපුරය	3	81,925.00
9	මහනුවර	3	64,850.00
10	පොළොන්නරුව	1	25,000.00
11	ගාල්ල	1	41,000.00
12	ගම්පහ	1	38,450.00
13	ගාල්ල/මාතර	1	11,850.00
එකතුව		**20**	**617,535.00**

2.1.5 භික්ෂු පුහුණු හා ආගමික සහජීවන වැඩසටහන

2.1.5.1 භික්ෂු පුහුණු ප්‍රවර්ධන වැඩසටහන

බුදු දහමේ දිගු කාලීන චිරස්ථිතිය සහ පැවැත්ම සඳහා විවිධ භාෂාවන් පිළිබඳ භික්ෂූන් වහන්සේලා සතු දැනුම, අවබෝධය හා ප්‍රායෝගික භාවිත හැකියාවන් වර්ධනය ඉතා වැදගත් වේ. ඒ වෙනුවෙන් මෙරට වැඩ වසන භික්ෂූන් වහන්සේලාගේ භාෂා ඥානය පුළුල් කිරීම සඳහා

දෙමළ, ඉංග්‍රීසි හා වෙනත් භාෂා ඉගැන්වීමට කටයුතු කරන අතර එමඟින් ලොව පුරා ධර්ම ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය වාතාවරණය සැලසීමද මෙම වැඩසටහනේ අරමුණ වේ.

2021 වර්ෂයේදී ද මෙම වැඩසටහන පහත සඳහන් ආයතන කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල අතර ඒ සඳහා ජාතික අයවැයෙන් වෙන් වූ මුදලින් පාඨමාලා අවසන්වීමේ ප්‍රගතිය මත ගෙවීම් සිදු කරන ලදී.

ආයතනය	පාඨමාලාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු.)
ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (සිබා විශ්ව විද්‍යාලය)	ඉංග්‍රීසි/ දෙමළභාෂා/ පරිගණක පුහුණු වැඩසටහන් (මහනුවර දිස්ත්‍රික්කය)	31	950,000.00
ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය	ජපන් සහතිකපත්‍ර පාඨමාලාව	40	79,620.00
ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	40	360,000.00
ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය	දෙමල භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	40	360,000.00
ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය	ජපන් භාෂා සහතිකපත්‍ර පාඨමාලාව	40	420,000.00
අස්ගිරි මහා විහාරයට අයත් මහා විහාර මහ පිරිවෙන	දෙමළ භාෂාව පාඨමාලාව	350	273,000.00
මහරගම සිරි වජිරඤාන පිරිවෙන (නිලභාෂා අධ්‍යයන පුහුණු ආයතනය)	ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලාව	57	175,000.00
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	දෙමළ භාෂා පුහුණු වැඩසටහන බස්නාහිර පළාත - විෂය නිර්දේශ සකස් කිරීම සඳහා	0	10,000.00
එකතුව		**598**	**2,627,620.00**

2.1.5.2 ආගමික සහජීවන වැඩසටහන

සෑම ආගමකටම පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් සියළු ආගමික හා ජනවාර්ගික කොටස් සමඟ අන්‍යෝන්‍ය අවබෝධයෙන් හා සහජීවනයෙන් ජීවත්විය හැකි සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම මෙම වැඩසටහනේ අරමුණයි. මේ යටතේ දිස්ත්‍රික්ක 12 ක ආගමික සහජීවන වැඩසටහන් 20 ක් සඳහා රු.මි. 2.19 ක ප්‍රතිපාදන නිදහස් කරන ලදී. කොවිඩ් 19 වසංගත තත්වය මත ජනතාව රැස් කිරීමේ ගැටළු පැවති බැවින් දිස්ත්‍රික්ක කිහිපයක පමණක් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2.1.6 ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත පල්ලේකැලේ ප්‍රසාංගික පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම.

පාරම්පරික කලා සම්ප්‍රදායන් මතු පරපුර වෙත දායාද කිරීමේ අරමුණින් ඉන්දියානු රජයේ මූල්‍ය ප්‍රදානයන් යටතේ මෙම ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මෙම ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 145 කි. ව්‍යාපෘතියට අදාළ අවබෝධතා ගිවිසුමේ කොන්දේසි වලට අනුව වැඩ වටිනාකම මත අගය කෙරුණු වැට් මුදල් ගෙවීම දේශීය අරමුදල් මගින් කලයුතු බැවින් 2021 වර්ෂය සඳහා මේ වෙනුවෙන් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 9.3 කි.

ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන කාර්යයන් ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය මඟින් සිදු කල අතර ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු මෙම අමාත්‍යාංශය, ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය, දළදා මාලිගාවේ විදේශ කටයුතු අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් මගින් සිදු කෙරේ. කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය මත ව්‍යාපෘති කාර්යය නිම කිරීම ප්‍රමාද වී පැවති අතර 2021 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය 83%ක් පමණ වේ .





2.1.7 විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම

විද්‍යාලංකාර පිරිවෙනට රජය මගින් අනුග්‍රාහක දායකත්වයක් ලබා දීමේ අරමුණින් එවකට පැවති නාගරික සංවර්ධන හා ජලප්‍රවාහන අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලද මෙම සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේ කටයුතු බුද්ධශාසන අමාත්‍යාංශ විෂය පථයට පැවරීමෙන් අනතුරුව අදියර V ක් දක්වා ඉදිකිරීමේ කටයුතු අවසන්ව ඇත.

2021.04.09 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ V වන අදියරෙහි ඉදිකිරීම් සඳහා රු.මි. 48.076 ක ප්‍රතිපාදන ලැබී ඇත. එමඟින් මේ වන විට

රු.මි.15.67 ක් සහ විවලන නියෝග 2 සඳහා රු.මි. 25.18 ක් හා ආරක්ෂක සේවා හා විදුලි බිල්පත් පියවීම සඳහා රු.මි. 2.72 ක් ගෙවා ඇත. ව්‍යාපෘතිය අමාත්‍යාංශය වෙත භාර ගෙන විද්‍යාලංකාර භාරය වෙත භාර දීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.





2.1.8 කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම.

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයේ හානියට පත් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව 2021 වර්ෂයේ මෙම අමාත්‍යාංශය වෙත රු.මි. 66.00ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, මීට අදාල ඉදිකිරීම් කටයුතු ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් සිදු කරනු ලබයි. 2021 වර්ෂයට අදාලව රු.මි. 11.72ක් වැය කර ඇත.

2.1.9 වෙනත්

2.1.9.1 බෞද්ධ උපදේශක සභාව

සම්බුද්ධ ශාසනයේ චිරජීවනය හා ආගමික මෙන්ම ශාසනික ගැටලු සම්බන්ධව රජයට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා ත්‍රෛනිකායික මහා සංඝරත්නයේ මූලිකත්වයෙන් හා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී ජනාධිපති උපදේශක සභාව රැස්වනු ලබයි.

2021 වර්ෂයේ ජනාධිපති බෞද්ධ උපදේශක සභාව 2021.02.12, 2021.03.19, 2021.04.23 හා 2021.07.16 යන දිනයන්හිදී පවත්වන ලදී. එහිදී බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල කටයුතු සම්බන්ධව මහා සංඝරත්නයේ උපදෙස් ලබා දීම සිදු කරනු ලැබේ.

2.1.9.2 බෞද්ධ විශ්වකෝෂය

බෞද්ධ විශ්වකෝෂය අන්තර්ජාලයට එක් කිරීමේ කටයුතු වෙනුවෙන් මෙම අමාත්‍යාංශයට 2021 වසරේදී රුපියල් මිලියන 6.0 ක් වෙන් වූ අතර, අමාත්‍ය මණ්ඩල තීරණ මත මෙම රු.මි.06 ක ප්‍රතිපාදන අවුරා තබන ලදී. බෞද්ධ විශ්වකෝෂය යාවත්කාලීන කිරීම සඳහා වෙනම කාර්යාලයක් සකස් කිරීම හා විධිමත් පරිදි කාර්ය මණ්ඩලයක් පත් කිරීමට අදාළ කටයුතු සැලසුම් කිරීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

2.1.9.3 වීසා නිර්දේශ ලබා දීම

දඹදිව වන්දනා චාරිකා යෙදෙන්නන්ට නිදහස් වීසා ලබා ගැනීමට නිර්දේශ ඉදිරිපත් කිරීමත්, විදේශගත වන භික්ෂූන් වහන්සේලාට හා විදේශවල සිට මෙරටට වැඩම කර මෙහි රැඳී සිටින භික්ෂූන් වහන්සේලාට වීසා ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමත් මෙම අමාත්‍යාංශයේ කාර්යභාරයකි.

I. පුජ්‍ය පක්ෂය / ගිහි පිරිස් වෙත දඹදිව වන්දනා ගමන් සඳහා වීසා නිර්දේශ ලබාදීම

පුජ්‍ය පක්ෂය / ගිහි පිරිස් වෙත දඹදිව වන්දනා ගමන් සඳහා නොමිලේ වීසා ලබාගැනීමට නිර්දේශ ලබාදීම සිදු කෙරේ. 2021 වර්ෂය තුළ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මෙම චාරිකා තාවකාලිකව අත්හිටුවා තිබූ අතර 2022 මාර්තු මස සිට නැවත චාරිකා ඇරඹීම සුදුසු බවට චාරිකා සංගම් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අපගේ නිර්ණායක දක්වා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් උපදෙස් ලබාගෙන ඇති අතර ඉදිරියට ලැබෙන ඉල්ලීම් අනුව වීසා නිර්දේශ ලබා දීම අඛණ්ඩව සිදුවේ.

II. අධ්‍යාපනික කටයුතු හා බෞද්ධ ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශීය භික්ෂූන් වහන්සේලා, මෙහෙණින් වහන්සේලා හා ආගමික කටයුතු සඳහා පැමිණෙන ගිහි පිරිස් වෙනුවෙන් වීසා නිර්දේශ ලබා දීම

මේ යටතේ පැමිණීමේ වීසා හා වාස වීසා වෙනුවෙන් නිර්දේශ ලබා දීම සිදුවේ. 2021 වසරේ වීසා නිර්දේශ ලබා දී ඇති ආකාරය පහත පරිදි වේ.

2021 වර්ෂයේ ලබා දුන් වීසා නිර්දේශ

අනු අංකය	රට	වාස වීසා	පැමිණීමේ වීසා
1	බංගලාදේශය	161	13
2	නේපාලය	65	3
3	කාම්බෝජය	110	19
4	චීනය	3	1
5	මියන්මාරය	48	1
6	ඉන්දියාව	30	2
7	ජපානය	10	-
8	ඇමරිකාව	15	-
9	එංගලන්තය	3	-
10	වියට්නාමය	21	7
11	කොරියාව	5	-
12	ජර්මනිය	5	1
13	චෙක් රාජ්‍යය	6	-
14	සිංගප්පූරුව	4	2
15	කැනඩාව	4	3
16	ප්‍රංශය	5	3
17	ඉතාලිය	2	-
18	ස්විට්සර්ලන්තය	2	-
19	ඔස්ට්‍රියාව	2	-
20	තායිලන්තය	3	-
21	ඔස්ට්‍රේලියාව	4	1
22	රුසියාව	3	2
23	හංගේරියාව	1	-
24	ආමේනියාව	1	-
25	ඉන්දුනීසියාව	3	2
26	ස්ලෝවැකියාව	-	1
27	රුමේනියාව	-	1

අනු අංකය	රට	වාස වීසා	පැමිණීමේ වීසා
28	නවසීලන්තය	1	-
29	ඊශ්‍රායලය	2	-
30	බෙල්ජියම	1	1
31	නෙදර්ලන්තය	1	-
මුළු එකතුව		520	63

III. අධ්‍යාපනික කටයුතු සඳහා හෝ ධර්ම දූත සේවය සඳහා ස්වාමීන් වහන්සේලා විදේශගත වීමේදී නිර්දේශ ලිපි නිකුත් කිරීම.

අන්තර් ජාතික වශයෙන් ථේරවාදී බුදු දහම ව්‍යාප්ත කිරීම සඳහා හෝ අධ්‍යාපනික කටයුතු සඳහා මෙරට ස්වාමීන් වහන්සේලා විදේශගත වීමේදී වීසා ලබා ගැනීම සඳහා අදාළ තානාපති කාර්යාල වෙත නිර්දේශ ලිපි ලබා දීම සිදුවේ.

2021 වර්ෂයේ ලබා දුන් නිර්දේශ ලිපි සංඛ්‍යාව

අනු අංකය	රට	ලබා දී ඇති නිර්දේශ ලිපි ප්‍රමාණය
1	ඉතාලිය	3
2	ජර්මනිය	3
3	ඉන්දියාව	12
4	ඇමරිකාව	26
5	නවසීලන්තය	1
6	ඔස්ට්‍රේලියාව	10
7	ජපානය	6
8	කැනඩාව	8
9	ස්විට්සලන්තය	2
10	නේපාලය	2
11	කොරියාව	6
12	ඊශ්‍රායලය	1
13	එංගලන්තය	23
14	ප්‍රංශය	16
15	තායිලන්තය	5
මුළු එකතුව		**124**

2.1.9.4 විශ්‍රාමශාලා නඩත්තුව හා සංවර්ධනය

මෙම අමාත්‍යාංශය සතුව දේශීය හා විදේශීය වශයෙන් පහත සඳහන් විශ්‍රාමශාලා පවතී. ඒවායේ නඩත්තුව හා පාලනය අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

- **නවදිල්ලි නුවර පිහිටි බෞද්ධ විශ්‍රාම ශාලාව**

නවදිල්ලියේ පහර්ගන්ජ්, වෙල්මිස්ෆෝඩ් මාවත යන ස්ථානයේ පිහිටා ඇත. ශ්‍රී ලංකා රජයට දක්වන අනුග්‍රහයක් ලෙස ඉන්දියාව මගින් ලබා දී ඇති භූමියක ස්ථාපිත බෞද්ධ විශ්‍රාම ශාලාවකි. ඉන්දියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.



- **නේපාලයේ පිහිටි දුටුගැමුණු විශ්‍රාම ශාලාව**

නේපාලයේ ලුම්බිණියෙහි රූපන්දෙහි යන ස්ථානයේ පිහිටා ඇත.නේපාලයේ ලුම්බිණි සංවර්ධන භාරය විසින් ශ්‍රී ලංකා රජය වෙත පිරිනමා ඇති භූමියක පිහිටා ඇති මෙම විශ්‍රාම ශාලාව නේපාලයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.



- **අනුරාධපුර කුරුන්දම්කුලම රජරට චාරිකා නිවාසය**

එකවර තිස්දෙනෙකුට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි මෙම නිවාඩු නිකේතනය අමාත්‍යාංශයේ පාලනය යටතේ පවතී.



2.1.10 ආගමික කටයුතු අංශය යටතේ ඉටුකල කාර්යයන්

ආගමික සහජීවනය උදෙසා සියලු ආගම්වලට අයත් දෙපාර්තමේන්තු එක් අමාත්‍යාංශයක් යටතේ ස්ථාපිතකර පවත්වාගෙන යන අතර, හින්දු ආගමික, මුස්ලීම් ආගමික හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තු පරිපාලනය හා කළමනාකරණ කටයුතු ආගමික අංශය මඟින් සිදුකරනු ලබයි.

ආගමික හා සමාජ සහජීවනය උදෙසා පහත සඳහන් කාර්යයන් මෙම අංශය මඟින් ඉටුකරනු ලැබේ.

- ‘‘ගම සමඟ පිළිසඳරක් තුළින් වැඩ සමඟ යළි ගමට’’ ජාතික වැඩසටහන මඟින් හඳුනා ගන්නා හින්දු, මුස්ලීම්, ක්‍රිස්තියානි ආගම් සම්බන්ධව පවතින ගැටලු එම දෙපාර්තමේන්තු වෙත යොමු කර අවශ්‍ය විසඳුම් ලබා දීම සහ එම ක්‍රියාවලිය අධීක්ෂණය.

- “ රට හදන සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ඒ ඒ ආගමික දෙපාර්තමේන්තු වෙත පැවරී ඇති කාර්යයන් අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිය විමසා බැලීම.
- හින්දු ආගමික, මුස්ලීම් ආගමික හා ක්‍රිස්තියානි ආගමික කටයුතු යන දෙපාර්තමේන්තු තුනෙන් නිර්දේශ කර අප වෙත යොමුකරනු ලබන ඒ ඒ ආගම් වලට අදාළ පූජ්‍ය ප්‍රසාදීන් හා පුද්ගලයන් සඳහා පැමිණීමේ වීසා ලබා දීම හා වාස වීසා දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂක නිෂ්කාෂණ ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කිරීම, එම අමාත්‍යාංශය විසින් දැනුවත් කරන වෙනත් විශේෂ කරුණු සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම, ආගමන විගමන දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධීකරණය සහ දැනුවත් කිරීම.
- ආගමික චාරිකා සඳහා වීසා සහන වෙනුවෙන් නිර්දේශ ලබා දීම
- කෝවිල්, පල්ලි හා දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ආධාර මුදල් ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අදාළ දෙපාර්තමේන්තු වෙත යොමු කිරීම.
- කෝවිල්, පල්ලි හා දේවස්ථාන මුල් කර ගනිමින් සමාජය තුළ පැන නගින නීතිමය හෝ සාමාජීය වශයෙන් ප්‍රශ්න නිරාකරණය කරගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වී, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දෙපාර්තමේන්තුවලට අවශ්‍ය උපදේශයන් හා නිර්දේශයන් ලබාදීම.
- දෙපාර්තමේන්තු තුනෙහි ආයතන කටයුතු වෙනුවෙන් අධීක්ෂණය හා නිර්දේශ ලබා දීම.
- ආගමික ග්‍රන්ථ මෙරටට ආනයනය කිරීමේදී එම ග්‍රන්ථ රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය ආරක්ෂක නිශ්කාෂණ ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට කටයුතු කිරීම.
- ආගම් අතර අන්තර් සහයෝගය හා සහෝදරත්වය වර්ධනය වන පරිදි සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- රාජසන්තක කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍යයන් ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් සහන මිලට ලබා දීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ආගමික කටයුතු උදෙසා දෙපාර්තමේන්තු වෙත විදේශයන්ගෙන් ලැබෙන පරිත්‍යාගයන් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වීම.

ඉහත පිටු අංක 01 සිට 25 දක්වා පිටුවලින් දක්වා ඇති තොරතුරු පරීක්ෂාකර බලා ඇති බවටත්, එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිණි
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, "දහම්පාය",
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

2.3 ඉදිරි ඉලක්ක

2.3.1 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	2022 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රතිපාදන/ ඉලක්ක	2022 ඉදිරි දැක්මට අනුව ඉලක්ක
01	ඌන සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය	අපේක්ෂිත ප්‍රතිපාදන (රු.මි) -100.00	ස්වාභාවික විපත් වලින් සිදුවූ ආපදා නිසා හානි වූ විහාරස්ථාන නගා සිටුවීම -රු.මි. 50.00 විහාරස්ථාන සඳහා සංඝාවාස හා සිල් මාතාරාම සඳහා ආවාස කුටිඇතුළු අත්‍යාවශ්‍ය විහාරාංග ඉදිකිරීම / විහාරස්ථාන ප්‍රතිසංස්කරණය - රු.මි. 50.00 (2021 වර්ෂයේ අතැති බිල්පත් පියවීම ද ඇතුළුව)
02	දුෂ්කර ප්‍රදේශ වල විහාරස්ථාන සංවර්ධනය	අපේක්ෂිත ප්‍රතිපාදන - රු.මි.500.00	ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව මඟින් දුෂ්කර ප්‍රදේශ බවට හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 100 ක විහාරස්ථානවල අත්‍යාවශ්‍ය ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ සිදු කිරීම - රු.මි.475.00 2022 රාජ්‍ය වෙසක් උත්සවය සිදු කිරීමට අපේක්ෂිත රත්නපුර, කුරගල රජමහා විහාරස්ථානයේ භික්ෂු නේවාසිකාගාරය ඉදිකිරීම - රු.මි.25.00
03	තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන	අපේක්ෂිත ප්‍රතිපාදන (රු.මි) -40	කේන්ද්‍රීය විහාරස්ථානයේ භෞතික පහසුකම් සංවර්ධනය කිරීම /දැනුවත් කිරීමේ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන - රු.මි 15.00 (2021 වර්ෂයේ අතැති බිල්පත් රු.මි. 2.28 දඇතුළුව) පුණ්‍යග්‍රාම වැඩසටහන (2022-2024) -රු.මි 19.00 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන -රු.මි 6.00
04	පූජාභූමි සංවර්ධනය	අපේක්ෂිත ප්‍රතිපාදන - රු.මි.20.0	ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති පූජාභූමි වල භෞතික යටිතල පහසුකම් - රු.මි.20 (2021 වර්ෂයේ අතැති බිල්පත් ගෙවීම ද ඇතුළුව) - රු.මි. 4.2
05	භික්ෂු පුහුණු හා ආගමික සහජීවන වැඩසටහන	අපේක්ෂිත ප්‍රතිපාදන - රු.මි.7.5	රජයේ හෝ පිළිගත් භාෂා අධ්‍යයන ආයතන සමඟ ඉංග්‍රීසි , දෙමළ භාෂා හා තොරතුරු තාක්ෂණ පාඨමාලා පැවැත්වීම / ආගමික සහජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.- රු.මි.7.5
06	ශ්‍රී දළදා මාලිගාවට අනුයුක්තව පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම.	අපේක්ෂිත ප්‍රතිපාදන - රු.මි.0.5	ඉදිකිරීම් නිම කිරීම.

03 පරිච්ඡේදය - 2021 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

ඒසීඒ-එෆ්

3.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තක්සේරු නැවත ගලපන ලද 2021 රු.	2,020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		283,135,000	173,100,000	ඒසීඒ-3
-	තැන්පතු		4,106,182	1,463,086	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		7,495,596	3,868,728	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		9,925,899	11,425,949	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**304,662,677**	**189,857,763**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**304,662,677**	**189,857,763**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**304,662,677**	**189,857,763**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
113,594,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලා	**5**	111,905,004	100,970,474	
166,970,300	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	100,750,657	72,682,142	ඒසීඒ-2(ii)
450,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	422,037	425,401	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
281,014,300	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**213,077,699**	**174,078,018**	
	මූලධන වියදම්				
13,600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	9,374,586	9,210,869	
78,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	17,478,797	5,002,121	
668,376,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	530,677,866	420,265,719	ඒසීඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
800,000	හැකියා වර්ධනය	**14**	199,000	50,500	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
760,776,000	**මුළු මූලධන වියදම් (උ)**		**557,730,249**	**434,529,208**	
	තැන්පතු ගෙවීම්		37,262,492	5,158,670	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		9,031,644	5,779,027	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**46,294,136**	**10,937,698**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		-	-	
1,041,790,300	**එ)**		**817,102,084**	**619,544,924**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(512,439,407)**	**(429,687,161)**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**0**	**0**	ඒසීඒ-3
(1,041,790,300)			**(512,439,407)**	**(429,687,161)**	

3.2 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයපිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවනවත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,060,474,786	1,055,012,562
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	22,944,435	21,408,386
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**1,083,419,221**	**1,076,420,948**
ශුද්ධ වත්කම් /ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(1,306,567)	(35,998,926)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,060,474,786	1,055,012,562
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	24,251,002	57,407,312
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**1,083,419,221**	**1,076,420,948**

පිටු අංක 27 සිට 30 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 53 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාප්තකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

.....17/02/2022

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ජී. සන්ධ්‍යා යාපාබණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
"දහම්පාය"
කොළඹ 07

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
නම : ජී. චින්. මුණසිංහ
දිනය : 2022.02.17

ප්‍රධාන ගණකාධිකාරි
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
"දහම්පාය"
කොළඹ 07.

දේශබන්ධු මහාචාර්ය කාපිල තුෂාරවර්ධන
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

2

3.3 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	නැවත ගලපන ලද 2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	9,925,899	11,425,942
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	283,135,000	173,100,000
අත්තිකාරම් අයකර ගැනීම්	7,910,933	6,188,003
තැන්පතු ලැබීම්	4,156,207	1,463,086
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**305,128,039**	**192,177,031**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	201,529,693	157,047,499
සහනාධාර සහ මාරුකිරීම්	422,037	425,401
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,164,908	5,716,469
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	9,877,176	7,812,375
තැන්පතු ගෙවීම්	18,603,081	5,158,670
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**231,596,895**	**176,160,414**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**73,531,144**	**16,016,617**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	73,531,144	16,016,617
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**73,531,144**	**16,016,617**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(73,531,144)**	**(16,016,617)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0.00**	**0.00**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		
	(1)	(2)	(3)	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)	(8)	(9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පුනරාවර්තන වියදම්											
පුද්ගල පඩිනඩි	107,700,000	2,470,000	3,424,000	113,594,000	111,905,004	-	-	-	-	-	111,905,004
ගමන් වියදම්	5,800,000	-	(2,900,000)	2,900,000	2,012,421	-	-	-	-	-	2,012,421
සැපයීම්	13,200,000	-	2,686,000	15,886,000	15,844,235	-	-	-	-	-	15,844,235
											-
නඩත්තු වියදම්	13,100,000	-	(3,421,000)	9,679,000	5,904,221	-	-	-	-	-	5,904,221
											-
සේවා	21,450,000	-	211,000	21,661,000	19,443,969	113,400,000	3,444,300	-	116,844,300	57,545,811	76,989,780
මාරුකිරීම්	450,000	-	-	450,000	422,037	-	-	-	-	-	422,037
						-	-	-	-	-	
වෙනත් පුනරාවර්තන වියදම්	-	-	-	-	-	-	-	-	-	-	-
මුළු එකතුව	**215,700,000**	**2,470,000**	**(3,424,000)**	**214,746,000**	**199,158,771**	**226,800,000**	**6,888,600**	**-**	**233,688,600**	**115,091,623**	**314,250,394**

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මූලධන වියදම්											
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	13,600,000	-	-	13,600,000	9,374,586	-	-	-	-	-	9,374,586
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	6,000,000	-	-	6,000,000	5,762,323	12,000,000	66,000,000	-	78,000,000	11,716,474	17,478,797
ප්‍රාග්ධන මාරුකිරීම්	-	-	-	-	-	620,300,000	48,076,000	-	668,376,000	530,677,866	530,677,866
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	-	-	-	-	-	-	-	-	-	-	-
හැකියා වර්ධනය	800,000	-	-	800,000	199,000	-	-	-	-	-	199,000
වෙනත් මූලධන වියදම්	-	-	-	-	-	-	-	-	-	-	-
මුළු එකතුව	**27,200,000**	**-**	**-**	**27,200,000**	**21,297,233**	**1,258,600,000**	**228,152,000**	**-**	**1,486,752,000**	**1,084,788,679**	**1,106,085,912**
මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව	**242,900,000**	**2,470,000**	**(3,424,000)**	**241,946,000**	**220,456,003**	**1,485,400,000**	**235,040,600**	**-**	**1,720,440,600**	**1,199,880,302**	**1,420,336,306**

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. 000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
නැත.					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	275,100	281,014	213,078	76%
ප්‍රාග්ධන	646,700	760,776	557,730	73%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	දිස්ත්‍රික්කය	වැය ශීර්ෂය	ජාතික වෙසක් උත්සවය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු වියදම	%
	වැය විෂයය		101-2-6-1409-(5)														
	අනුමත ප්‍රතිපාදනය		ප්‍රතිපාදන වෙන්කිරීම්	හර කිරීම්													
	40,400,000																
1	කොළඹ	255	-					5,000.00								5,000.00	
2	ගම්පහ	256	-													-	
3	කළුතර	257	-													-	
4	මහනුවර	258	-													-	
5	මාතලේ	259	-													-	
6	නුවරඑළිය	260	-													-	
7	ගාල්ල	261	-													-	
8	මාතර	262	-													-	
9	හම්බන්තොට	263	-													-	
10	යාපනය	264	-													-	
11	මන්නාරම	265	-													-	
12	වවුනියාව	266	-													-	
13	මුලතිව්	267	-													-	
14	කිලිනොච්චිය	268	-													-	
15	මඩකලපුව	269	-													-	
16	අම්පාර	270	-													-	
17	ත්‍රිකුණාමලය	271	-													-	
18	කුරුණෑගල	272	-													-	
19	පුත්තලම	273	-													-	
20	අනුරාධපුරය	274	-													-	
21	පොළොන්නරුව	275	-													-	
22	බදුල්ල	276	-													-	
23	මොණරාගල	277	-													-	
24	රත්නපුර	278	-													-	
25	කෑගල්ල	279	-													-	

අනු අංකය	දිස්ත්‍රික්කය	වැය ශීර්ෂය	ජාතික වෙසක් උත්සවය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු වියදම	%
	වැය විෂයය		101-2-6-1409- (5)														
	අනුමත ප්‍රතිපාදනය		ප්‍රතිපාදන වෙන්කිරීම්	හර කිරීම්													
	40,400,000																
26	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	201	-													-	
27	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	211	-													-	
28	රේගු දෙපාර්තමේන්තුව	247	-													-	
29	විදේශ කටයුතු අමාත්‍යාංශය	112	-			58,248.51	-4173.47									54,075.04	
30	ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය	224	-													-	
31	ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය	223	1,026,297.43													-	0%
32	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	320	270,450.00												263,225.00	263,225.00	97%
33	විදුලිබල බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය		-													-	
34	ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	222	144,080.00													-	0%
35	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	992													1,076,282.43	1,076,282.43	
	මුළු එකතුව		**1,440,827.43**	**-**	**-**	**58,248.51**	**(4,173.47)**	**5,000.00**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**1,339,507.43**	1,398,582.47	97%
		101					**297,700.00**								**(290,500.00)**	7,200.00	
	මුළු වියදම			**-**	**-**	**58,248.51**	**293,526.53**	**5,000.00**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**1,049,007.43**	**1,405,782.47**	

අනු අංකය	දිස්ත්‍රික්කය	වැය ශීර්ෂය	පුණ්‍යග්‍රාම වැඩසටහන	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු වියදම	%
	වැය විෂයය		101-2-6-1409-(6)														
	අනුමත ප්‍රතිපාදනය		ප්‍රතිපාදන වෙන්කිරීම්														
	20,000,000																
1	කොළඹ	255	53,400.00												32,600.00	32,600.00	61%
2	ගම්පහ	256	22,700.00												17,110.00	17,110.00	75%
3	කළුතර	257	97,850.00												52,201.53	52,201.53	53%
4	මහනුවර	258	152,055.00												128,414.19	128,414.19	84%
5	මාතලේ	259	39,350.00										1,500.00		10,000.00	11,500.00	29%
6	නුවරඑළිය	260	26,600.00												17,500.00	17,500.00	66%
7	ගාල්ල	261	103,150.00			18,500.00									52,734.36	71,234.36	69%
8	මාතර	262	121,820.00									(48,000.00)	54,750.00	16,663.87	22,967.14	46,381.01	38%
9	හම්බන්තොට	263	73,300.00											3,995.00	35,325.00	39,320.00	54%
10	යාපනය	264	-													-	
11	මන්නාරම	265	-													-	
12	වවුනියාව	266	25,060.00							5,200.00	3,200.00				16,660.00	25,060.00	100%
13	මුලතිව්	267	18,000.00												18,000.00	18,000.00	100%
14	කිලිනොච්චිය	268	-													-	
15	මඩකලපුව	269	-													-	
16	අම්පාර	270	28,400.00												2,800.00	2,800.00	10%
17	ත්‍රිකුණාමලය	271	22,600.00												21,450.00	21,450.00	95%
18	කුරුණෑගල	272	201,957.50									9,950.00	3,300.00	820.00	107,796.48	121,866.48	60%
19	පුත්තලම	273	76,340.00				11,800.00								29,977.00	41,777.00	55%
20	අනුරාධපුරය	274	176,192.50											17,076.64	93,800.00	110,876.64	63%
21	පොළොන්නරුව	275	24,850.00												16,350.00	16,350.00	66%
22	බදුල්ල	276	103,720.00													-	0%
23	මොණරාගල	277	51,850.00												24,878.50	24,878.50	48%
24	රත්නපුර	278	90,290.00												61,710.00	61,710.00	68%
25	කෑගල්ල	279	60,670.00						(6,900.00)	9,475.00					29,186.00	31,761.00	52%

අනු අංකය	දිස්ත්‍රික්කය	වැය ශීර්ෂය	පුණ්‍යග්‍රාම වැඩසටහන	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු වියදම	%
	වැය විෂයය		101-2-6-1409-(6)														
	අනුමත ප්‍රතිපාදනය		ප්‍රතිපාදන වෙන්කිරීම්														
	20,000,000																
26	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	201	-													-	
27	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	211	-													-	
28	රේගු දෙපාර්තමේන්තුව	247	-													-	
29	විදේශ කටයුතු අමාත්‍යාංශය	112	-													-	
30	ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය	224	-													-	
31	ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය	223	-													-	
32	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	320	-													-	
33	විදුලිබල බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය		-													-	
34	ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	222	-													-	
35	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	992													75,830.00	75,830.00	
	මුළු එකතුව		1,570,155.00	-	-	18,500.00	11,800.00	-	(6,900.00)	14,675.00	3,200.00	(38,050.00)	59,550.00	38,555.51	867,290.20	968,620.71	62%
		101				4,110.00	-									4,110.00	
	මුළු වියදම			-	-	22,610.00	11,800.00	-	(6,900.00)	14,675.00	3,200.00	(38,050.00)	59,550.00	38,555.51	867,290.20	972,730.71	
ඉතිරිය																	

අනු අංකය	දිස්ත්‍රික්කය	වැය ශීර්ෂය	වෙනත් සේවා	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු වියදම
	වැය විෂයය		101-2-6-1409-(7)													
	අනුමත ප්‍රතිපාදනය															
	20,000,000															
1	කොළඹ	255	-													-
2	ගම්පහ	256	-													-
3	කළුතර	257	-													-
4	මහනුවර	258	-													-
5	මාතලේ	259	-													-
6	නුවරඑළිය	260	-													-
7	ගාල්ල	261	-													-
8	මාතර	262	-													-
9	හම්බන්තොට	263	-													-
10	යාපනය	264	-													-
11	මන්නාරම	265	-													-
12	වවුනියාව	266	-													-
13	මුලතිව්	267	-													-
14	කිලිනොච්චිය	268	-													-
15	මඩකලපුව	269	-													-
16	අම්පාර	270	-													-
17	ත්‍රිකුණාමලය	271	-													-
18	කුරුණෑගල	272	-													-
19	පුත්තලම	273	-													-
20	අනුරාධපුරය	274	-													-
21	පොළොන්නරුව	275	-													-
22	බදුල්ල	276	-													-
23	මොණරාගල	277	-													-
24	රත්නපුර	278	-													-
25	කෑගල්ල	279	-													-

අනු අංකය	දිස්ත්‍රික්කය	වැය ශීර්ෂය	වෙනත් සේවා	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු වියදම
	වැය විෂයය		101-2-6-1409-(7)													
	අනුමත ප්‍රතිපාදනය															
	20,000,000															
26	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	201	-													-
27	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	211	-													-
28	රේගු දෙපාර්තමේන්තුව	247	-													-
29	විදේශ කටයුතු අමාත්‍යාංශය	112	-													-
30	ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය	224	-													-
31	ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය	223	-													-
32	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	320	-													-
33	විදුලිබල බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය		-													-
(අ) මුදල් රෙගුලාසි 1644(11) පරිදි මෝටර් වාහනයක් පුද්ගලික වැඩපලකදී අලුත්වැඩියා කර ගැනීමේදී එක් එක් වැඩය වෙනුවෙන් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද රු.839,370 ක් වැයකර අවස්ථා 7කදී සිදුකල අලුත්වැඩියා වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්කෘතික මධ්‍යස්ථානවල සේවකයින්ගේ රාජකාරී වේලාවන්, 2016 මාර්තු 21 දිනැති අංක 03/2006 දරන ප්‍රවර්ධන චක්‍රලේඛය මගින් සාමාන්‍ය රාජකාරී වේලාවෙන් වෙනස් කර තිබුනද ඒ සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) සංස්කෘතික මධ්‍යස්ථානවල පිහිටුවා තිබූ සංවර්ධන සංගම් සඳහා, සංවර්ධන සංගම් අරමුදල් පිහිටුවීම සඳහා සහ මධ්‍යස්ථාන වල අයකරන පාඨමාලා ගාස්තු, පුස්ථකාල සාමාජික ගාස්තු සහ පෙර පාසල් දායක මුදල් වැනි අයකිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොතිබුණි. අදාල අයකිරීම් අමාත්‍යාංශයේ ආදායම් ලෙස ගෙන නොතිබූ අතර සංස්කෘතික මධ්‍යස්ථානවල කටයුතු සඳහා එම ආදායම් වැයකිරීමට අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් අනුමැතිය ලබා දී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 සාහිත්‍ය කලා උළෙල පැවැත්වීම සඳහා 2021වාර්ෂික අයවැය මගින් රු.මී.18.70 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද වර්ෂය තුළ එම වැඩසටහන පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සවිකිරීම සඳහා අයවැය මගින් රු.4,000,000 ක වාර්ෂික ප්‍රතිපාදන ලබාදී තිබුණද මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම.

රු.මිලියන 1350 ක (අදියර 1-5 දක්වා) මූලික ඇස්තමේන්තුවක් මත 2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05 ක් දක්වා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1245.18 ක පිරිවැයක් දරා තිබුණු අතර 2021 වර්ෂයේ ආරක්ෂක සේවා හා විදුලි බිල්පත් පියවීම් සඳහා රු.මිලියන 2.72 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් අවසන් කර විද්‍යාලංකාර භාරය වෙත භාරදීමෙන් පසුව ගොඩනැඟිල්ල බදු දීමෙන් ලැබෙන ආදායමෙන් මෙම ව්‍යාපෘතියේ vi වන අදියර ඉදිකිරීම් සඳහා එකහව් ඇති බව පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ විසින් දන්වා තිබූ නමුත් මෙතෙක් ගොඩනැඟිල්ල විද්‍යාලංකාර භාරය වෙත පැවරීම් සඳහා කටයුතු කර නොතිබුණි.

ඒ අනුව ගොඩනැඟිල්ලේ v වන අදියරේ කටයුතු 2019 මාර්තු 15 දින වන විට අවසන් කර තිබුණද vi අදියරේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය සහ ආරක්ෂක වියදම් දරමින් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය කෙරේ.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) තිරසර පුණ්‍යාග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක කළුතර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන හා දහම්පාසල් 04 ක් සඳහා පුස්තකාල පහසුකම් සැපයීම වෙනුවෙන් රු.530,000 ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එම ප්‍රතිපාදන වෙන්කර මාස 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් අදාල උපකරණ දහම්පාසල් වෙත ලැබී නොතිබුණි.

(ආ) මාවතගම, බමුණාකොටුව හා පොල්ගහවෙල යන සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම්වලට අදාල කොන්ත්‍රාත්තු පිළිවෙලින් රු.14,665,744 කට රු.19,999,732 කට හා රු.11,086,971 කට 2016 වසරේ සමාගමකට පවරා තිබුණි. අදාල ඉදිකිරීම් පිළිවෙලින් 2016 දෙසැම්බර් 25, 2016 දෙසැම්බර් 23 හා 2017 ජනවාරි 03 යන දිනවල නිමකල යුතු වුවද 2021 දෙසැම්බර් දක්වා අදාල ඉදිකිරීම් නිමකර ගොඩනැඟිලි භාර දී නොතිබුණි.

3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) බෞද්ධ විශ්වකෝෂය අන්තර්ජාල ගත කිරීම.

බෞද්ධ විශ්ව කෝෂය අන්තර්ජාල ගත කිරීමේ කාර්යය සඳහා අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද රු.මිලියන 6 ක ප්‍රතිපාදන මුදල් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අයත් කටයුත්තක් ලෙස 2021 ජුනි 29 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එසේ වුවද, එම ප්‍රතිපාදනවලින් අපේක්ෂිත කාර්යය ඉටුකිරීම සඳහා 2022 වර්ෂයේ ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් 2021 සැප්තැම්බර් 09 වන දින නැවත එම ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණු අතර වර්ෂය අවසාන වන විටත් අදාල වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් තොරව ප්‍රතිපාදන මුදල් නැවත භාණ්ඩාගාරය වෙත යාවා තිබුණි.

(ආ) රු.21,383,325 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබූ උහණ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2015 වර්ෂයේ සිට 2021 දක්වා වරින් වර රු.40,047,970 ක ප්‍රතිපාදන අමිපාර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණද, ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර නොතිබුණි.

3.1.5 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්

සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් 2008 ඔක්තෝබර් 29 දිනැති අංක CH/26/2008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2009 පෙබරවාරි 12 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2008 නොවැම්බර් 17 දින අංක PV 66112 යටතේ ලියාපදිංචි කර තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති ස්වකීය කොටස් වලින් සියයට 50 ක් හෝ වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් විසින් හෝ දරනු ලබන සමාගම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු වුවද අමාත්‍යාංශයේ පූර්ණ නිමිකාරිත්වය සතු මෙම සමාගමේ 2018/2019, 2019/2020 හා 2020/2021 යන මූල්‍ය වර්ෂ වලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අදාල සමාගම පිහිටුවා ඇත්තේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු බාහිර ආයතන ලවා ඉටුකරවා ගැනීමේදී සිදුව තිබූ අපහසුතා හා ගැටලු මඟහරවා ගැනීම පිණිස වුවද සමාගම විසින් 2009 සහ 2010 කාල සීමාව තුළ භාරගන්නා ලද, අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල ඉදිකිරීම්, 5% ක පමණ ආන්තිකයක් තබාගෙන උප කොන්ත්‍රාත්කරුවන්ට පවරා ඉටුකරවා ගැනීම තුළ එම අපහසුතා හා ගැටලු තවදුරටත් සිදුව තිබුණි.

(ඇ) වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ අනුව පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ අනුකූල වන බවට දක්වා තිබූ අවශ්‍යතා 11 ක් අනුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්කෘතික අංශය සතු වාහන 16 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදාහැර තිබුණද එම මාරු කිරීම් හා පැවරීම් සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසෙහි 8.1 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්කෘතික අංශය සතු අපහරණය කල යුතුව පැවති වාහන 06 ක් සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 (ආ) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද විගණන විමසුම් 1ක් සඳහා පිළිතුරු මෙම වාර්තාවේ දිනය වන විටත් ලබා දී නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) රු.මිලියන 312.49 ක් වැය කර ඉදිකර තිබූ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ වර්ග අඩි 33547ක විශාල ඉඩකඩ ප්‍රමාණයක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණද අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිවෙලින් රු.4,200,000 ක හා රු.6,816,000 ක කුලියකට වාර්ෂික කුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වා ගෙන යමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් 2020 විගණන වාර්තාවේ ද සඳහන් කර තිබූ නමුත් ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) නාගදීප විහාරස්ථානයේ සංවර්ධන කටයුතු

වෙසක් උත්සවය පැවැත්වීමට සැලසුම් කර තිබූ යාපනය දිස්ත්‍රික්කයේ විහාරස්ථානවලට අදාලව සිදුකරන ලද ප්‍රතිසංස්කරණ සඳහා නාගදීප විහාරස්ථානය සඳහා රු.12,736,743 ක මුදලක් වැය කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විහාර මන්දිරය ප්‍රතිසංස්කරණය

විහාර මන්දිරයේ ජලකාන්දුව වැළැක්වීමට අවශ්‍ය ක්‍රමවේද අනුගමනය කර පිපිරීම් සිදු වී ඇති ස්ථාන සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කර ජලය කාන්දුවීම වළක්වන තීන්ත 3 වරක් ආලේප කිරීමට සහ තවත් කාර්යයන් කිහිපයක් ඉටු කිරීම සඳහා රු 4,500,888 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර විගණිත දිනය වූ 2022 පෙබරවාරි 19 වන විටත් ජලකාන්දු වීම් සිදුවෙමින් පවතින බවත් දියසෙවල බැඳී ඉහළ කොටසේ පැත්තක් හානි වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.

(ii) පොත්ගුල් විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.

පොත්ගුල් විහාරයේ අත්වැට ඉදිකිරීම හා අමතර නිම කිරීම් සඳහා රු.මිලියන 1.7 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණද දාළ කාර්යයන් ඇස්තමේන්තු කර නොතිබීම හේතුවෙන් එක් කණුවකට රු.3,500 බැගින් බීරළු කණු 87 ක් සඳහා වූ රු.304,500 ක වියදම විහාරාධිපති ස්වාමීන් වහන්සේට දැරීමට සිදුවී තිබුණි. ප්‍රතිපාදන මුදලට අමතර තවද, විහාර ගෙයි බිම සහ පොළව අතර නිමාව නියමිත පරිදි සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(iii) විදේශීය බැතිමතුන් සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.

මෙම කාර්යය සඳහා රු.1,834,946 ක මුදලක් අනුමත කර තිබූ අතර ඉදිරිපස බිත්තියේ විදුරු ගල් යෙදීම සහ වැසිකිළි පද්ධතියේ වහළ මත ජල කාන්දුව වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(iv) දේශීය බැතිමතුන් සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම

මෙම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව රු.1,834,946 ක් වූ අතර වැසිකිළි වහළයේ ජල කාන්දුවීම් වැලැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබූණි. තවද, වැසිකිළි පරිශ්‍රය අවට ජලය මඟින් අපවිත්‍ර වී මඩ වීම වැළැක්වීම උදෙසා සිමෙන්ති ගල් ඇතිරීම විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ දායකත්වයෙන් සිදුවී තිබුණි.

(v) වැසිකිළි ආවරණ තාප්පය ඉදිකිරීම.

වැසිකිළි පද්ධතියේ ආරක්ෂාව සඳහා මෙම තාප්පය ඉදිකිරීමට රු.908,810 ක ප්‍රතිපාදන සලසා තිබුණද තාප්පය නිම කිරීමෙන් පසු ගේට්ටුවක් යෙදීම විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ දායකත්වයෙන් සිදු කර තිබූණි.

(vi) විහාර භූමියේ ඇති විශාල ගස් වටා කළුගල් ආවරණ බැමි ඉදිකර තිබුණද එම ඉදිකිරීම් වල ඉරි තැලීම් පැවති අතර කළු ගල් තාප්පය වටා කපරාරු සිදු කර නොමැති බැවින් එහි කල් පැවැත්ම අවිනිශ්චිත විය.

(vii) කොවිඩ් මර්ධන මාර්ගෝපදේශ අනුව රාජ්‍ය වෙසක් උත්සවය අවලංගු කර තිබුණද විහාරයට ඇතුළුවන ස්ථානයේ තාවකාලික තොරණක් ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.475, 000 ක මුදල නාවික හමුදාව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(viii) වෙසක් උත්සවය සඳහා සකස් කිරීමට නියමිතව තිබූ වේදිකාව සඳහා අවශ්‍ය රෙදි ආවරණ (canopy) වෙනුවෙන් රු. මිලියන 1.02 ක මුදලක් නාවික හමුදාව වෙත නිදහස් කර තිබූණි. කොරෝනා වසංගතය හේතුවෙන් වෙසක් උත්සවය අවලංගු වුවද, අදාල මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) උක්ත සඳහන් සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය මාසිකව වාර්තා කරන ලෙස නාවික හමුදාපති දැනුවත් කර ඇතත් ප්‍රගතිය සමාලෝචනය කළ බවට හෝ ප්‍රගති වාර්තා ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) වාහන අලුත්වැඩියා කිරීමේදී ටෙන්ඩර් පිළිබඳ සාමාන්‍ය නියෝග අදාල කරගත යුතු වුවද, අංක WP PB– 6252 දරන මෝටර් රථය අලුත්වැඩියා කිරීමේදී මුදල් රෙගුලාසි 1644 (IV) අනුව කටයුතු නොකර 2017 නොවැම්බර් මාසයේදී පුද්ගලික සමාගමක් වෙත සෘජුවම අලුත්වැඩියාව පවරා තිබුණි. අදාල සමාගම විසින් රථය පරීක්ෂා කිරීමේ ගාස්තු හා වාහනය නවතා තැබීමේ ගාස්තු ලෙස දිනකට රු.500 බැගින් ගෙවන ලෙස 2020 වසරේදී දන්වා තිබුණද මේ පිලිබඳ අවධානය යොමු කර නොතිබීම නිසා අදාල වාහනය ඉක්මනින් හා අඩු පිරිවැයකින් අලුත්වැඩියා කර ධාවනයට එක් කර ගැනීමට නොහැකිව තිබූ අතර අදාල මඟින්ම සමාගම රු.1,258,981 ක් වැය කරමින් අලුත්වැඩියාව සිදු කර ගැනීමට සිදු වී තිබුණි.

(ඇ) අන්තර් රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය-2020 සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත රු.328,800 ක් (VAT සහිත) ගෙවා ඉහත තරඟාවලියේ ජයග්‍රාහී නිර්මාණ ඇතුලත් කරමින් "ප්‍රභාෂ්වර" නමින් ග්‍රන්ථයක පිටපත් 300 ක් මුද්‍රණය කර තිබූ අතර ග්‍රන්ථය මුද්‍රණය කර අමාත්‍යාංශය වෙත භාරදී තිබුණේ සම්මාන ප්‍රදානෝත්සවය අවසන් වී මාස 04 කටත් පසුව බැවින් ග්‍රන්ථය 2021 මාර්තු 18 දින පැවති සම්මාන ප්‍රදානෝත්සවයේදී බෙදා දීමට නොහැකිවී තිබුණි.

(ii) මෙම ග්‍රන්ථයෙහි පිටපත් 300 න් පිටපත් 200ක් අමාත්‍යාංශ ප්‍රචර්ධන අංශයෙහි 2022 මාර්තු 31 දින වන විටද පැවතිණි.

4 යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වේ. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරවද ගණන් දීමේ නිලධාරී විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී සහ වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුය.

එසේ වුවද, අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද වසර කීපයක සිට අදාල තනතුර පුරප්පාඩුව පැවතුණි. අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 194 ක් ක්‍රියාත්මකව පැවතියද සංස්කෘතික අංශය සඳහා 2021 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර හා ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණන කටයුතුද ඉටු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 169 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 50 කි. ඒ අතුරින් සහකාර ලේකම් තනතුරු 03 ක සංවර්ධන නිලධාරී තනතුරු 15 ක සංවර්ධන සහකාර තනතුරු 11 ක සහ කළමනාකරණ සහකාර නිලධාරී තනතුරු 8ක පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතුණු අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, කාර්යාල කාර්ය සහායක තනතුරක අතිරික්තයක් පැවතුණි.

(ආ) සංස්කෘතික අංශයේ සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 201 ක් අනුමත කර තිබුණද තත්‍ය සංඛ්‍යාව 133 ක් වූ අතර තනතුරු 68 ක් එනම් සියයට 34 ක් පුරප්පාඩු පැවති අතර සංස්කෘතික අංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 141 ක් වුවද තත්‍ය සංඛ්‍යාව 179 ක් වුයෙන් තනතුරු 38 ක් එනම් සියයට 27 ක අතිරික්තයක් පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය සතුව සංස්කෘතික මධ්‍යස්ථාන 194 ක් පැවතුණද මධ්‍යස්ථාන මුරකරුවන් 306 ක් සේවයේ යොදවා තිබූ අතර 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මුරකරුවන් 114 ක් අනුමත කිරීම හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා වී තිබුණි. විගණනය විසින් සිදුකල පරීක්ෂාවන් අනුව මෙම අතිරික්ත මුරකරුවන් 105 දෙනාගේ සේවය කාර්යක්ෂම අයුරින් ලබා ගැනීමට ද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

එච්.එම්.රණසිංහ බණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස		
	100-90 %	75-89 %	50-74 %
1. පූජාභූමි වල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	√	-	-
2. දහම්පාසල් වල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	√	-	-
3. විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	√	-	-
4. සමාජීය ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බලගැන්වූ ගම්මාන ඇති වීමේ ප්‍රමාණය	-	-	√
5. ශ්‍රී දළදා මාලිගාවට අනුයුක්තව පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම් නිම කිරීමේ ප්‍රමාණය	-	√	-
6. විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම	√	-	-
7. සාමණේර හා උපසම්පදා භික්ෂු පුහුණුව	-	-	√
8. කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම් නිම කිරීමේ ප්‍රමාණය	-	-	-

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49 (%)	50-74 (%)	75-100 (%)
1. පූජාභූමිවල සංරක්ෂණය සහ සංවර්ධනය	පූජාභූමිවල භෞතික/යටිතල පහසුකම් ඉහළ නැංවීම	පූජාභූමි වල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය			√
2. අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ දරුවන් බිහි කිරීම.	දහම් පාසල් සඳහා භෞතික පහසුකම් සැපයිම	දහම්පාසල් වල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය			√
3. විහාරස්ථානයන්හි පවතින භෞතික අඩුපාඩු අවම කිරීම.	විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් ඉහළ නැංවීම	විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය			√
4. සමාජීය, ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පූර්ණ පුද්ගලයින් බිහි කිරීම.	සමාජීය , ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බල ගැන්වූ ගම්මාන ඇති කිරීම	සමාජීය ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බලගැන්වූ ගම්මාන ඇති වීමේ ප්‍රමාණය		√	
5. ශිල්පීන්ට පුහුණු ස්ථානයක් සකස් කිරීම.	ශ්‍රී දළදා මාලිගාවට අනුයුක්තව පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම	ඉදිකිරීම් නිම වීමේ ප්‍රමාණය			√
6. පූර්ණ දැනුමැති භික්ෂූන් වහන්සේලා බිහි කිරීම.	සාමණේර හා උපසම්පදා භික්ෂු පුහුණුව	වාර්ෂිකව පුහුණු වන භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව		√	
7. ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ථේරවාද බුදු දහම ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම	විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම (V වන අදියර)	ඉදිකිරීම් නිම වීමේ ප්‍රමාණය			√
8. අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ දරුවන් බිහි කිරීම	කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් නිම කිරීම	දහම්පාසලේ භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක අතරින් ‘‘තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සහ ඵලදායී වගවීම සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම’’යන 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට මෙම අමාත්‍යාංශය මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදු වේ.

ඒ අනුව යමින් ළමා සමාජය ඵලදායී හා විනය ගරුක කිරීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් වෙනුවෙන් ඉරිදා දිනයන්හි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර දහම් පාසල් යටිතල පහසුකම් සැපයීමට වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය සීමා සහිත වීමත්, ස්වේච්ඡා ගුරුවරුන්ගෙන් පමණක් දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සිදුවි තිබීමත්, ඉරිදා දින දරුවන් සඳහා වෙනත් උපකාරක පන්ති පැවැත් වීම මත දරුවන් දහම් පාසල් වෙත පැමිණීම දුර්වලවීමත් ළමා සමාජය තුල දහම් දැනුම වර්ධනය කිරීමට පවතින බාධාවන් වේ.

ජනගහනයෙන් 72% ක් පමණ වන බෞද්ධ ජනතාව දිවයින පුරා විසිරී සිටියද දුෂ්කර ප්‍රදේශවල පිහිටි සමහර විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා නොසිටීම හෝ අල්ප වශයෙන් සිටීමද ජනතාවට ලබා දිය යුතු ශාසනික මෙහෙවර ලබා දීමට බාධාවක් වී ඇත.

පුණ්‍යග්‍රාම වැඩසටහන තුලින් ජනතාව තුල අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කලද සියළු ක්ෂේත්‍ර වල සංවර්ධනයක් ඇති කිරීමට මෙය ප්‍රමාණවත් නොවන අතර අනෙකුත් ආයතනවල සහායද ලැබීම අවශ්‍යව පවතී.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජනතාව ඒකරාශී කිරීමේ ගැටළු පැවති බැවින් පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්, ආගමික සහජීවන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීමට ගැටළු ඇතිවිය.

එසේ වුවද පවතින සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කර ගනිමින් 2021 වර්ෂය තුල නියමිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල අතර ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතිය ඉහල ප්‍රතිශතයක් ගැනීමෙන් ඒ බව තහවුරු වේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2021.12.31 දිනට)

සේවක මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	21	15	06
තෘතීක	05	04	01
ද්විතියික	143	103	40
ප්‍රාථමික	50	47	03

6.2 කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම

ද්විතියික තනතුරු අතර තනතුරු පුරප්පාඩු 40ක් පැවතියද එම බහුතර පුරප්පාඩු සංවර්ධන නිලධාරී සේවයේ පවතින පුරප්පාඩු වේ. එම පුරප්පාඩු වෙනුවෙන් උපාධිධාරී අභ්‍යාසලාභීන් 18 දෙනෙකු අනුයුක්තව සිටින අතර ඉතිරි පුරප්පාඩු වෙනුවෙන්ද කාර්ය මණ්ඩලය ඉල්ලා ඇත. නමුත් දැනට කාර්යය මණ්ඩලය ප්‍රශස්ථ මට්ටමින් යොදවා ගනිමින් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට උපරිමයෙන් කටයුතු කිරීම සිදු කරනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධන

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
1.	කාර්යාල කාර්ය සහායක සඳහා පුහුණු වැඩසටහන	නිලධාරීන් - 28	එක් දින	103	-	දේශීය	සේවකයින්ගේ කාර්යක්ෂමතාවයේ වර්ධනයක් ලබා ගැනීමට හැකි වීම හා ඉහළ නිලධාරීන් වෙත ඔවුන්ගෙන් මනා සේවයක් ලබා ගැනීමට හැකිවීම
2	රියදුරන් සඳහා පුහුණු වැඩසටහන	නිලධාරීන් - 21	එක් දින	96	-	දේශීය	
3.	සංවර්ධන නිලධාරීන්, කළමණාකරණ සේවා නිලධාරීන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම	නිලධාරීන් - 31	එක් දින	61		දේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	√		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්	-	අදාළ නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	අදාළ නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-	අදාළ නොවේ	
1.6	වෙනත්	-	අදාළ නොවේ	
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	√		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	√		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	√		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	√		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	√		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා දී තිබීම	√		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර සිටීම	√		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම.	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	√		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	√		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	√		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	√		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	√		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	√		
9.5	2016.06.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	√		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	√		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	√		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	√		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	√		
12.2	හිඟ හිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	√		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	√		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	√		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	√		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	√		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	-	අදාළ නොවේ	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම	-	අදාළ නොවේ	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	-	අදාළ නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්යමණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම	√		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	√		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	√		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අඩුම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	√		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	√		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	√		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	√		

සංස්කෘතික කටයුතු අංශය

පරිච්ඡේදය - 01 ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රෞඩ උරුමයන් සංරක්ෂණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පූර්ණ වගකීම දරමින්, සාහිත්‍ය හා කලාව පෝෂණය කරමින්, අනන්‍ය ශ්‍රී ලාංකීය ජාතියක් බිහි කිරීමේ උදාර කර්තව්‍ය ඉටු කිරීමට සංස්කෘතික කටයුතු අංශය බැඳී සිටී. මේ සඳහා සංස්කෘතික කටයුතු අංශය වශයෙන් අප, ‘‘රට හඳන සෞභාග්‍යයේ දැක්ම’’ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, තිරසර සංවර්ධන වැඩසටහන පාදක කරගනිමින් යහ ගුණයෙන් පිරිපුන් වූ සංවේදී මිනිසුන්ගෙන් සපිරුණු තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් වෙත පිය නැගීමට අවැසි කාර්යභාරය ඉටු කරමින් සිටී. ඒ අනුව 2021 වසර තුළ අමාත්‍යාංශයේ කාර්යයන් අතරින් සංස්කෘතික කටයුතු අංශයේ කාර්ය සාධනය මෙම කොටසට අන්තර්ගත වේ.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තිරසාර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්

සංස්කෘතික කටයුතු අංශය

මෙහෙවර

සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ස්ථානීය හා අස්ථානීය සංරක්ෂණය, චිත්‍රපට, නාට්‍ය හා රංග කලාවන්, ස්පෘෂ්‍ය - අස්පෘෂ්‍ය උරුමය හා රාජ්‍ය ලේඛන සංරක්ෂණය කිරීම සහ ශ්‍රී ලාංකීය සංස්කෘතිකාංග සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම

අරමුණු

රටක සංස්කෘතිය, එම රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා හඳුන්වා දෙනු ලබන සියලු වැඩසටහන් වඩාත් ඵලදායී ලෙස සඵල කර ගැනීම සඳහා ඉවහල් වන ජනතා හැසිරීම මෙහෙය වන ප්‍රධාන මෙවලම ලෙස සලකා අරමුණු හඳුනාගෙන ඇත.

- රටේ පොදු ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීමට හේතුවන ආකාරයෙන් ජනතාව ස්වයංව මෙහෙයවන සාධනීය සංස්කෘතික පරිසරයක් රට තුළ ගොඩනැගීම

- ශ්‍රී ලාංකීය බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්ව ගෙන ශ්‍රී ලාංකික වූ මහ සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහ හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග එවැනි හානිවලින් වළක්වා ගැනීම

- සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම මඟින් රටේ ජනතාවගේ ජීවිතයේ සංස්කෘතිකමය හැඩ ගැස්ම සකස්කර ගැනීමට මං සැලසීම

- සාධනීය සංස්කෘතිකාංග හඳුනා ගැනීමට හා ඒවා තම ජීවිතයට යාකර ගැනීමට ජනතාව පෙළඹවීම ඒ මඟින් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇති සංස්කෘතියක් ගොඩනැගීම

- සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර අභ්‍යන්තර සාධක හඳුනාගැනීමේ හා ඒව නිශේධනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබා දීම

- දේශාභිමානී චින්තනය, එය පෙරටු කරගත්, සංවර්ධන ඉලක්ක සපුරාලීමට සමත්, ස්වයං අභිප්‍රේරණික වූත්, සාමූහිකවූත්, බලවේගයක් ලෙස සමාජය තුළ මුල් බැස ගැනීමට සැලැස්වීම

1.3 ප්‍රධාන කාර්යයන්

- සංස්කෘතික කටයුතු අංශයට සහ එම අංශය අනුබද්ධිත දෙපාර්තමේන්තු හ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළව ක්‍රියාත්මක කළයුතු නීති හා අණ පනත්වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම
- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලු අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම

- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන්ට හානි නොවන පරිදි සංස්කෘතිය පදනම් වූ සංචාරක වැඩසටහන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
- සිංහල විශ්ව කෝෂය, සිංහල ශබ්ද කෝෂය හා මහා වංශය සම්පාදනය සඳහා අඛණ්ඩව අවශ්‍ය පියවර ගැනීම
- ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදවා ගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනය සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම
- රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය හා සංරක්ෂණය කිරීම
- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලය, ජාතික චිත්‍රපට සංස්ථාව, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම, ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය හි මධ්‍යම සංස්කෘතික අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති සියලුම විෂයයන් අධීක්ෂණය කිරීම.

1.4 සංස්කෘතික කටයුතු අංශය - සංවිධාන සැලැස්ම - 2021



1.5 අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

I.  සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලාංකීය ජනතාව අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ සංවේදී මිනිසුන් බවට පත් කිරීමේ ඒකායන අපේක්ෂාව සපුරා ගැනීම වස්, ශ්‍රී ලාංකික සංස්කෘතිය ගොඩනැගීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම මෙම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

A. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන

- ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල
- නිදහස් මන්දිරය
- මහාවංස සම්පාදන කාර්යාලය
- ශබ්දකෝෂ කාර්යාලය
- විශ්වකෝෂ කාර්යාලය
- ජන සංගීත සංරක්ෂණ ඒකකය
- එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල
- වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය
- ජාතික කලා නිකේතනය - මහනුවර කුන්ඩසාලේ
- උතුරු දකුණු මිතුරු සෙවණ - මිහින්තලේ
- පොත් ගබඩාව හා පොත් අලෙවිසැල
- රාජ්‍ය නැටුම් කණ්ඩායම හා රාජ්‍ය සංගීත කණ්ඩායම

මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන අනෙකුත් කටයුතු

- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය උත්සව/උළෙල සංවිධානය කිරීම හා කලාකරු සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා විශේෂ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

II. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

1877 වර්ෂයේ ස්ථාපනය කරන ලද ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින්, සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රදර්ශනය හා ප්‍රචාරණය කිරීමත්, සංස්කෘතික හා ස්වාභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය හා රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීම සිදු කරයි.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- දිවයින පුරා පිහිටුවා ඇති ජාතික කෞතුකාගාර (10ක්)
- මානව විද්‍යා අංශය
- මානව වංශ විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- සංරක්ෂණ අංශය
- පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය

III. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

සංස්කෘතික දායාදයේ කොටසක් ලෙස රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය සහ සංරක්ෂණය උදෙසා ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ ඊට අදාළ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ස්ථිර සංරක්ෂණය සඳහා රාජ්‍ය ලේඛන සහ අද්විතීය පෞද්ගලික ලේඛන ආබද්ධ කර ගැනීම, අදාළ නීති රීතිවලට අනුකූලව සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය කිරීම, අදාළ නීතිමය තැන්පතුවට පුවත්පත් සහ ප්‍රකාශන උපචිත කරගැනීම, මෙන්ම රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේ දී සහ මහජන පර්යේෂණය සඳහා තැන්පතු ලේඛනවලින් තොරතුරු

සමුද්ධනය කිරීමට පහසුකම් සැලසීම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- රාජ්‍ය ලේඛන ආබද්ධ කරගැනීම් අංශය
- ප්‍රදර්ශන අංශය
- පොත් සහ පුවත්පත් ලියාපදිංචිය අංශය
- ලේඛන සංරක්ෂණය අංශය
- පුවත්පත් සූක්ෂම ඡායාගත කිරීමේ අංශය
- ලේඛනාගාර ගොඩනැගිල්ල පුළුල් කිරීමේ අංශය
- ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය අංශය
- පර්යේෂණ අංශය
- මහජන සම්බන්ධතා අංශය

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

I. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් ලෙස, දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියලුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත. එහිදී උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන දැක්ම අනුව විමර්ශනය කර කරනු ලැබේ. ඒ අනුව ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය මඟින් මේවා සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂා කර බලා වර්ගීකරණයට ලක් කිරීම, වත්මන් ප්‍රධාන කාර්ය ලෙස දක්වනු ලැබේ.

II. ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

1971 අංක 47 දරන පනත මඟින් 1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කරන ලද, ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව මෙරට සිනමා කර්මාන්තයේ පරිපාලනය

සහ නියාමනය සඳහා ඇති එකම රාජ්‍ය ආයතනය වේ. නව තාක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කරමින් තෘප්තිමත්, වගකීම් හඳුනාගත්, සුහදශීලී සේවයක් ගනුදෙනුකරුවන්ට ලබා දෙමින්, නිර්මානකරණයට අවශ්‍ය අධ්‍යාපනය, අනුබලය හා සුහසාධනය ලබා දෙමින් ගුණාත්මක සිනමා සංස්කෘතියක් බිහි කිරීම උදෙසා මෙම ආයතනය කටයුතු කරයි. 1999-06-17 දිනැතිව එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්, ඩික්සන් නිලවීර මහතා විසින් නිකුත් කරන ලද ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය මඟින් චිත්‍රපට බෙදා හැරීම මණ්ඩල 05ක් යටතේ ක්‍රියාත්මක වේ. 2021.12.31 දිනට දිවයින පුරා සිනමා ශාලා 124ක් ක්‍රියාත්මක වේ.

III. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

අභාවප්‍රාප්ත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ මතකය සදාකාලිකව පවත්වා ගැනීම සඳහා ‘‘එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම’’ ලෙස පදනමක් 1975 පෙබරවාරි 04 වන දින පිහිටුවා ඇත. 1975 අංක 02 දරණ පාර්ලිමේන්තු පනතක් සහ 1981 සහ 1983 සංශෝධන මගින් පදනම බලාත්මක කර ඇත. දකුණු ආසියාවේ ප්‍රමුඛතම උත්සව සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය බවට පත් වීමේ දැක්මෙන් යුතුව වෙළඳ නාමය, භෞතික සම්පත් සහ මානව ප්‍රාග්ධනය නව්‍යකරණයෙන් ඉහළ නැංවීමෙන් සංවිධානයේ සුවිශේෂී තත්වයක් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම මෙහි මූලික කාර්යභාරයයි. මෙම පදනම යටතේ ප්‍රධාන අංග තුනක් ක්‍රියාත්මකයි.

- එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව (BMICH) - 1976 දී නොබැඳි සම්මේලනය සඳහා ඉදිකරන ලද අතර, රටේ සෑම ජාතික හා ජාත්‍යන්තර සමුළුවක් සඳහාම පහසුකම් සපයන ප්‍රධාන ආයතනය ලෙස ක්‍රියා කරයි.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය - ජාත්‍යන්තර සබඳතා සහ භාෂා පාඨමාලා ක්‍රියාත්මක කිරීම සිදු කරයි.
- කෞතුකාගාර - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක කෞතුකාගාරය හා සිරිමාවෝ බණ්ඩාරනායක කෞතුකාගාරය ලෙස කෞතුකාගාර දෙකකි.

IV. **ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය**

ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපති "ජූනියස් රිචඩ් ජයවර්ධන" ජනාධිපතිවරයාගේ සංකල්පයකට අනුව 1988 අංක 77 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම මධ්‍යස්ථානය පුස්තකාලයකින්, කෞතුකාගාරයකින්, ජනාධිපති ලේඛනාගාරයකින් සහ ජපන් කෞතුකාගාරයකින් සමන්විත වේ. එහි කෞතුකාගාරය තුළ ජයවර්ධන මහතාගේ පෞද්ගලික පුස්තකාල එකතුව සහ ඔහුගේ දේශපාලන දිවියට අදාළ ලිපි ලේඛන මෙන්ම ජනාධිපති මහලේකම් කාර්යාලයේ පැවති සමහර ලිපි ලේඛන සහ වාර්තා ද ඔහුගේ ධූර කාලය තුළ ඔහුට ලැබුණු තෑගි භෝග ද තැන්පත් කර ඇත. මෙම මධ්‍යස්ථානය ප්‍රදර්ශනය සඳහා මහජනතාවට විවෘතව පවතින අතර මෙමගින් විවිධ සමාජ සේවා කටයුතු රැසක් ද වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබයි.

V. **මධ්‍යම සංස්කෘතික අරමුදල**

ශ්‍රී ලාංකේය උරුමයන් ජගත් ආශ්චර්ය බවට පත් කිරීම උදෙසා, ජාතික මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද, වැදගත් වන ලෝක උරුම ප්‍රදේශවල ඇති ස්මාරක, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසර හා අධීක්ෂණය මත කැණීම් කර සංරක්ෂණය කිරීමත්, එම පුරාවිද්‍යා භූමි ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමත් අරමුණු කරගෙන මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවා ඇත. ඒ සඳහා අරමුදල් රැස්කර 1980 අංක 57 දරණ පාර්ලිමේන්තු පනත මගින් මෙම (මධ්‍යම සංස්කෘතික) අරමුදලට බලය ලබා දී ඇත.

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

2021 වසර තුළ දී සංස්කෘතික කටයුතු අංශය මගින් විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොමැත.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සංස්කෘතික කටයුතු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහනකි සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන. මේ යටතේ සංස්කෘතික කටයුතු අංශය මගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම රංගකලා අධ්‍යයනාගාර, පුස්තකාල පහසුකම් සහ නවීන පහසුකම්වලින් යුත් රංග ශාලාවක් ස්ථාපනය කිරීම අරමුණු කර ගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම "සංස්කෘතික මධ්‍යස්ථානයක්" පිහිටුවීමට කටයුතු කර ඇත. මෙය සාම්ප්‍රදායික රංග කලාවන් සහ සම්භාව්‍ය සංස්කෘතික අංග සංරක්ෂණය කර, ඉන් පෝෂිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට හා මෙම සංස්කෘතිකාංග පොදු මහජනයා අතරට ගෙන යාමට දායක වන විධිමත් යාන්ත්‍රණයකි.

සංස්කෘතික මධ්‍යස්ථාන පිළිබඳ මූලික තොරතුරු

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශ ගණන	පිහිටුවා ඇති ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	විවෘත කිරීමට නියමිත සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	ඉදි කරමින් පවතින නව සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	තව දුරටත් ඉදිකල යුතු සංස්කෘතික මධ්‍යස්ථාන ගණන
මධ්‍යම	මහනුවර	20	14	-	01	05
	මාතලේ	11	11	-	-	00
	නුවරඑළිය	05	04	-	-	01
නැගෙනහිර	අම්පාර	20	07	01	04	08
	මඩකලපුව	14	04	02	-	08
	ත්‍රිකුණාමලය	11	06	-	-	05
උතුරු මැද	අනුරාධපුර	22	13	-	02	07
	පොලොන්නරුව	07	05	01	-	01
උතුර	යාපනය	15	08	02	-	05
	කිලිනොච්චි	04	-	-	-	04
	මන්නාරම	05	-	-	-	05
	මුලතිව්	06	-	-	-	06
	වවුනියා	04	01	01	-	02
වයඹ	කුරුණෑගල	30	18	05	01	06
	පුත්තලම	16	07	02	-	08
සබරගමුව	කෑගල්ල	11	09	-	01	01
	රත්නපුර	17	08	-	01	08

දකුණ	ගාල්ල	19	14	-	01	04
	හම්බන්තොට	12	07	-	01	04
	මාතර	16	17	-	-	00
ඌව	බදුල්ල	15	13	-	-	02
	මොනරාගල	11	07	-	01	03
බස්නාහිර	කොළඹ	13	07	-	-	06
	ගම්පහ	13	09	01	-	03
	කළුතර	14	12	-	01	01
	එකතුව	**331**	**201**	**15**	**13**	**122**

සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ලබාදෙන මූලික සේවාවන්

පුහුණු පාඨමාලා පැවැත්වීම

දීපව්‍යාප්තව පිහිටා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 201, අගයෙන් ඉහල කලා නිර්මාණ බිහිකිරීමට අවශ්‍ය අධ්‍යයනය හා පුහුණුව ලබාගත හැකි ආයතනික ව්‍යූහයක් බවට පත් කිරීම අරමුණු කර ගනිමින්, එම සංස්කෘතික මධ්‍යස්ථානවල, අංකුර කලාකරුවන් සඳහා නව දැනුමක් ලබා දෙන පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු සලසා ඇත. එසේම ගායන වාදන කුසලතාවයන් ලබාගැනීමට කැමති ඕනෑම කෙනෙකුට සහභාගී විය හැකි පරිදි වැඩසටහන් ද සංස්කෘතික මධ්‍යස්ථානවල පැවැත්වේ. විශේෂයෙන් ජනශ්‍රැති පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා මේවායෙහි අවස්ථාව සලසා දී ඇති අතර අතිරේකව පහත පාඨමාලා ද සංවිධානය කර ඇත.

- උඩරට, පහතරට, සබරගමු, භරත, කථක් සහ ජන නැටුම් පාඨමාලාව
- පෙරදිග සහ අපරදිග සංගීතය පාඨමාලාව
- නාට්‍ය හා රංග කලා පාඨමාලාව
- චිත්‍ර, මූර්ති සහ කැටයම් කලා පාඨමාලාව
- ජ්‍යොතිෂ්‍ය පාඨමාලාව
- කායික හා මානසික වර්ධන පාඨමාලාව
- අත්කම් නිපැයුම්, බතික් නිර්මාණ පාඨමාලාව
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත භාෂාවන් පිළිබඳ පාඨමාලාව
- අංගම්පොර ශිල්ප පාඨමාලාව
- මුස්ලිම් රබන් / ලී කෙළි නර්තන පාඨමාලාව
- ජනසන්නිවේදන පාඨමාලාව

- දේශීය හෙළ වෙදකම පාඨමාලාව
- චීන සාම්ප්‍රදායික සටන් කලා පාඨමාලාව
- රූපලාවන්‍ය පාඨමාල

පුස්තකාල සේවාවන් සැපයීම

සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම පිහිටුවා ඇති පුස්තකාල මගින් පාසල් ළමුන්ගේ සහ ජනතාවගේ කියවීමේ රුචිය ඉහළ නැංවීමේ සහ අධ්‍යාපනයට රුකුලක් වීමේ අදහසින් මෙම සේවාව ක්‍රියාත්මක කර ඇත. ඇතැම් මධ්‍යස්ථාන මගින් දුෂ්කර ප්‍රදේශවල පිහිටුවා ඇති ග්‍රාමීය සමාජ සඳහා ජංගම පුස්තකාල සේවා ද ආරම්භ කර ඇත.

සංස්කෘතික සේවාවන් සැපයීම

ප්‍රාදේශීය ජනතාවගේ අවශ්‍යතාවය මත ආගමික/සංස්කෘතික උත්සව අවස්ථා සඳහා ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් සංස්කෘතික සේවාවන් සැපයීම සිදු කරයි. මේ යටතේ ජය මංගල ගාථා කණ්ඩායම්, හේවිසි කණ්ඩායම්, මඟුල් බෙර කණ්ඩායම්, වෙස් නැටුම් කණ්ඩායම්, නර්තන කණ්ඩායම්, වීදි නාට්‍ය කණ්ඩායම් හා ගිහි පිරිත් කණ්ඩායම් ආදිය සපයනු ලබයි.

ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික හා සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් වසර පුරා විවිධ ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික වැඩසටහන් තම සංවර්ධන අරමුදලින් /ප්‍රදේශවාසීන්ගේ මූල්‍ය දායකත්වයෙන්/රජයේ දායකත්වයෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික නර්තන සංචිතය පවත්වා ගැනීම

සංස්කෘතික මධ්‍යස්ථානවල සෞන්දර්යය පාඨමාලා හදාරන සිසුන් අතුරින් ප්‍රතිභාපූර්ණ සිසු සිසුවියන්ගෙන් සමන්විත නර්තන සංචිතයක් පවත්වාගෙන යනු ලබයි. රාජ්‍ය/ජාතික උත්සව සඳහාත් විදේශීය සංස්කෘතික සංචාර සඳහාත් මෙම නර්තන සංචිතය දායකත්වය සපයනු ලබයි.

2.1 සංස්කෘතික කටයුතු අංශය මඟින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

* අංක 21/1596/304/134 හා 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ අංක iii අනුව අවුරා තබන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)

අනු අංකය	වැය විෂය විස්තරය	2021 ප්‍රතිපාදන රු.මී.	* අවුරා තබන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මී.	වියදම 2021.12.31 දිනට රු.මී.	මූල්‍ය ප්‍රගතිය
සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම					
01.	සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 101-02-05-09-1409	60.00	-	28.14	47%
02.	සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා බෙර/සංගීත උපකරණ/ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිලදී ගැනීම 101-02-05-0-2002	0.37	-	0.2	54%
03.	සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම 101-02-05-0-2102	5.00	-	5.00	100%
04.	සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම 101-02-05-0-2103	8.00	-	8.00	100%
05.	සංස්කෘතික මධ්‍යස්ථාන සුළු අළුත්වැඩියාව, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු 101-02-05-0-2001	6.00	-	6.00	100%
06.	සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම් 101-02-05-23-2104	140.00	6.00	74.14 (අතැති බිල් වටිනාකම රු.මී.37.00කි)	79%

විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (පුනරාවර්තන) ක්‍රියාත්මක කිරීම					
07.	සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් 101-2-5-6-1508	10.00	-	2.60	26%
08.	රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම (අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය) 101-2-5-8-1409	5.30	-	5.00	94%
09.	විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන 101-2-5-27-1409	12.64	2.5	7.02	56%
විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (ප්‍රාග්ධන) ක්‍රියාත්මක කිරීම					
10.	ශිල්ප ගම්මාන වැඩසටහන 101-02-05-21-2506	2.00	-	1.63	82%
11.	සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් 101-02-05-29-2507	2.00	1.00	0.00	0%
12.	ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් 101-02-05-31-2509	24.83	4.57	4.30	17%

2.1.1 සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
101-02-05-09-1409

සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වසරේ රු.මි.60.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර සංස්කෘතික මධ්‍යස්ථාන 201හි සෞන්දර්ය හා කුසලතා සංවර්ධන පාඨමාලා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.5,000.00ක් හා අනෙකුත් පාඨමාලා සඳහා රු.4,750.00ක් වශයෙන් සම්පත්දායකයින් 2,330කට සම්පත්දායක දීමනා ගෙවීම් කරන ලදී.

2.1.2 සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා බෙර/සංගීත උපකරණ/ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිලදී ගැනීම

101-02-05-0-2002

සංස්කෘතික මධ්‍යස්ථානවල අධ්‍යයන පාඨමාලා සඳහා සංගීත හා නර්තන පුහුණු වාද්‍ය භාණ්ඩ අත්‍යාවශ්‍ය වන බැවින් සංස්කෘතික මධ්‍යස්ථානවල ඇති නැවත භාවිතයට ගත හැකි අබලන් තත්ත්වයේ පවතින සංගීත හා නර්තන භාණ්ඩ අළුත්වැඩියා කිරීම සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

එලෙස සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා බෙර / සංගීත උපකරණ / ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිළදී ගැනීම් වෙනුවෙන් 2021 වර්ෂයට වෙන් කරන ලද රු.මි.0.20ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් මීගහකිවුල, හාලිඇල, පලාගල හා ගෝනාපිනුවල යන සංස්කෘතික මධ්‍යස්ථාන 4හි සංගීත භාණ්ඩ හා නර්තන වාද්‍ය භාණ්ඩ අලුත්වැඩියා කරන ලදී.

2.1.3 සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම

101-02-05-0-2102

සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යුහය සක්‍රීයව පවත්වාගෙන යාම සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම වෙනුවෙන් 2021 වර්ෂයට රු.මි.5.00ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එම ප්‍රතිපාදන වැය කරමින් රිදීගම, මාවතගම, මාදම්පෙ, මහකුඹුක්කඩවල, මදුරාවල, පාලින්දනුවර හා බුලත්සිංහල යන සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා පොත්පත්, නර්තන/සංගීත උපකරණ හා කාර්යාලී/ය ලී බඩු මිල දී ගන්නා ලදී.

2.1.4 සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම

101-02-05-0-2103

සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාගැනීම වෙනුවෙන් 2021 වර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු.මි. 8.00කි. එම මුදල වැය කරමින් මාවතගම, ඇහැටුවැව හා පාලින්ද නුවර යන සංස්කෘතික මධ්‍යස්ථානවලට අවශ්‍ය කාර්යාල උපකරණ, සංගීත උපකරණ, පරිගණක උපකරණ හා නර්තන උපකරණ ලබා ගැනීම ද, කැලණිය නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයට අවශ්‍ය කාර්යාල උපකරණ හා සංගීත හා නර්තන උපකරණ මිළදීගැනීමද සිදු කරන ලදී.

2.1.5 සංස්කෘතික මධ්‍යස්ථාන සුළු අළුත්වැඩියාව, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු සිදු කිරීම
101-02-05-0-2001

මේ යටතේ දිවයින පුරා විහිදී පිහිටා ඇති බද්දෙගම, ඇල්පිටිය, පිටබැද්දර, තණමල්විල, මීගහකිවුල, තිරප්පනේ, කැකිරාව, හිඟුරක්ගොඩ, පාදුක්ක, පොල්ගහවෙල, අඹන්පොල, කන්තලේ, දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව හා උකුවෙල යන සංස්කෘතික මධ්‍යස්ථාන වෙනුවෙන් 2021 වසරට වෙන් කරන ලද රු.මි. 6.00ක මුදල භාවිතා කරමින් සුළු අළුත්වැඩියා, ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සිදු කරන ලදී.

2.1.6 සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම
101-02-05-23-2104

සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් - 2021 භෞතික ප්‍රගතිය 2021.12.31 දිනට

2021.12.31දිනට ඉදිකර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව	201
2021.12.31 දිනට ඉදිකිරීම් අවසන් කර විවෘත කිරීමට නියමිත නව සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව	15
2021.12.31 දිනට ඉදිකරමින් පවතින නව සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව	13
2021 වර්ෂයේ සුළු අලුත්වැඩියා වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු සිදුකල සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව	15

2.1.7 සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
101-2-5-6-1508

මේ යටතේ මහනුවර දළදා පෙරහැර සඳහා ආධාර ලබාදීමත් මාතලේ සහ නුවරඑළිය දේවාලවල පෙරහැර සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ප්‍රතිපාදන ලබාදීමත් සිදු කරන ලදී. මෙයට අතිරේකව වාර්ෂිකව සංවිධානය කරනු ලබන හුණුපිටිය ගංගාරාම පෙරහැරට නර්තන කණ්ඩායම් සම්බන්ධ කරදීම සහ අවුරුදු නැකත් සිට්ටුව මුද්‍රණය කර බෙදා හැරීම ද සිදු කරන ලදි.

2.1.8 රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීමට (අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය) අදාල කටයුතු සිදු කිරීම

101-2-5-8-1409

රාජ්‍ය සේවකයන්ගේ කුසලතාවයන් ඇගයීම සඳහා අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. මේ වන විට සියලු තරග අංශයන්ට (කෙටි නාට්‍ය, කෙටි චිත්‍රපට, ඡායාරූප තරඟාවලිය හා ප්‍රදර්ශය, ආදී) අදාළව නිර්මාණ කැඳවීම අවසන් කර ඇති අතර නිර්මාණ විනිශ්චය සඳහා යොමුකර, ජයග්‍රාහකයින් තෝරාගනු ලැබිණි. මීට අදාල සම්මාන උත්සවය පැවැත්වීම සඳහා මේවන විට කටයුතු සූදානම් කර ඇත.

2.1.9 විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

101-2-5-27-1409

සංස්කෘතික කටයුතු අංශය මගින් දෙස් විදෙස් සංස්කෘතික සම්බන්ධතා වර්ධනය කර ගනිමින් දේශීය සංස්කෘතිය සංචාරක කර්මාන්තය හා එක්ව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද "Cultural Saubhagya" ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රසංගයේ මූලික කටයුතු ආරම්භ කරන ලදි. මේ සඳහා ජාතික නර්තන සංවිතයේ ශිල්පීන් පුහුණු කිරීම ආරම්භ කරන ලද අතර බත්තරමුල්ල "අපේගම" පරිශ්‍රයේ දී එම පුහුණුවීම් සිදුකිරීමට අදාල කටයුතු සම්පාදනය කර ඇත.

2.1.10 ශිල්ප ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

101-02-05-21-2506

සංචාරක කර්මාන්තය ඔස්සේ දේශීය ශිල්ප කලාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පාරම්පරික ශිල්ප කලා ආදර්ශ ගම්මානයක් වන හාලි-ඇල කඳන සංචාරක ශිල්ප කලා ගම්මානයට රු.මි.2.00ක ප්‍රතිපාදන 2021 වසර සඳහා වෙන් වී ඇත. සංචාරක ප්‍රදර්ශන අවකාශ පුළුල් වන පරිදි මෙම ආදර්ශ ශිල්ප කලා ගම්මානයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු වලට අදාල ගැමි ගෙදර මණ්ඩපය, කුඹල් කාර්මාන්තය, ධීවර කර්මාන්තය, පතල් කර්මාන්තය, සෙක්කු කර්මාන්තය හා අම්බලම ආශ්‍රිත ඉදිකිරීම් මේ වන විට නිම කර ඇත. දෙවන අදියර ඉදිකිරීම් කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

2.1.11 සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම

101-02-05-29-2507

දේශීය අනන්‍ය සංස්කෘතික පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සංස්කෘතික කටයුතු අංශය මගින් මේ වන විට පර්යේෂණ ඒකකය පිහිටුවා අවසන් කර ඇති අතර මේ

වෙනුවෙන් තෝරාගත් පර්යේෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. මෙම පර්යේෂණ කටයුතු සඳහා සකස් කරන ලද ප්‍රශ්නාවලිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යවා ඇති අතර මේ සඳහා වෙන් වී ඇති මුදල රු.මි. 2.00කි. මේ වන විට පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයක් ඇති වී ඇත.

2.1.12 ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

101-02-05-31-2509

මෙම වැය ශීර්ෂය යටතේ ප්‍රධානවම, ජාතික නර්තන සංචිතය ස්ථාපිත කිරීම හා ‘‘ප්‍රතිභා’’ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය පැවැත්වීම සිදු කර ඇත.

- **ජාතික නර්තන සංචිතය ස්ථාපිත කිරීම.**

සංස්කෘතික කටයුතු අංශයට අනුබද්ධව, පළාත් මට්ටමින් කුසලතාවයන් දක්වන අංකුර කලාකරුවන් තෝරාගනිමින් ජාතික නර්තන සංචිතය ස්ථාපිත කර ඇත. මෙමගින් දේශීය මෙන්ම විදේශීය ප්‍රසංග අවස්තා ඔස්සේ එම අංකුර කලාරුවන්ට ජාතික හා ජාත්‍යන්තර ප්‍රාසාංගික අත්දැකීම් ලබාදීම හා ඔවුන් දිරිගැන්වීම අරමුණු කර ඇති අතර සංචාරක කර්මාන්තය සමග ඒකාබද්ධව ප්‍රාසාංගික ප්‍රදර්ශන ඉදිරිපත් කිරීමට ද ඔවුනට අවකාශ සැලසේ.

- **‘‘ප්‍රතිභා’’ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය පැවැත්වීම**

පාරම්පරික නර්තන කලාවන් නූතන පරපුරට හඳුන්වා දීමේ අරමුණින් කෙමෙන් වියැකී යන උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන් නූතන ශිෂ්‍ය ප්‍රජාව වෙත නැවුම් මුහුණුවරකින් හඳුන්වාදීම අරමුණු කරගත් වැඩසටහනක් ලෙස සංස්කෘතික මධ්‍යස්ථාන අතර පවත්වන ‘‘ප්‍රතිභා’’ සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය හඳුන්වා දිය හැකිය. පාරම්පරික නර්තන කලාව ප්‍රවර්ධන කිරීම ද ප්‍රචාරණය කිරීමද වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම වැඩසටහනේ ප්‍රධාන අභිප්‍රායයි. මේ වන විට ‘‘ප්‍රතිභා’’ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලියේ පළාත් තරඟ හා ජාතික මට්ටමේ තරඟ පවත්වා අවසන් කර ඇත.

2.2 අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන ලබන ව්‍යවස්ථාපිත ආයතන

3 * අංක 21/1596/304/134 හා 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ අංක iii අනුව අවුරා තබන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)

	ආයතනය	ප්‍රාග්ධන ප්‍රතිපාදන 2021 රු.මි.	* අවුරා තබන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.	වියදම 2021.12.31ට රු.මි.	මූල්‍ය ප්‍රගතිය %
01	ප්‍රසිද්ධ රඟහළ් පාලක මණ්ඩලය	4.35	-	0.50	11.5%
02	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	40.00	-	11.00	27.5%

2.2.01 ප්‍රසිද්ධ රඟහළ් පාලක මණ්ඩලය

2021.12.31 දින වන විට නව සිනමා ශාලාවේ ලොබිය සඳහා සෝෆා සෙට් 09ක් හා ස්ටූල් 02ක් මිලදී ගැනීම සිදු කර අවසන් කරන ලදී.

2.2.02 ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

- සිනමා ශාලාවේ එකෝස්ටික් බෝර්ඩ් සවිකිරීම සඳහා අවශ්‍ය ඇලබාමා රෙදි / LED බල්බ හා සනීපාරක්ෂක උපකරණ ලැබී අවසන්ය.Color Grading Workstation and Monitor, Color Grading Software Suite and Device at Sarasavi studio, 4K ප්‍රක්ෂේපණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම / 4K Projector මිලදීගැනීම Filter Fan හා Survey ස්ථාපිත කිරීම / Waterproofing of Roof Slabs at NFC Cinema, Supplying a Digital Hand held sound recorder and microphone යන කාර්යයන් සඳහා මිල දී ගැනීමේ නියෝග නිකුත් කර ඇත.
- Color Grading monitor and screen calibration tool, DCP Creator Sooftware / සරසවි චිත්‍රාගාරයේ දෙබස් පටිගත කිරීමේ මැදිරිය සහ අමතර ශබ්ද පටිගත කිරීමේ මැදිරිය සඳහා එකෝස්ටික් පැනල් මිලදී ගැනීම සහ ශබ්ද උපකරණ මිල දී ගැනීම / මහජන ඇමතුම් පද්ධතියක් ස්ථාපනය යන ව්‍යාපෘති අවසන් කර ඇති අතර ශබ්ද පද්ධතිය සේවාකරණය හා අලුත්වැඩියාව අවසන් කිරීම පිළිබඳ උපදේශක වාර්තාව ලැබීමට නියමිතය.

2.3. විශේෂ ජයග්‍රහණ

- **ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පීන්ගේ අතින් නිමැවෙන "දුම්බර රටා කලාල" අස්පර්ශනීය ලෝක උරුමයන් බවට පත් කිරීම**

ශ්‍රී ලංකාව විවිධ අස්පර්ශ උරුමයන්ගෙන් පරිපූර්ණ රටක් ලෙස හඳුනාගත හැකිය. මේ අතරින් රූකඩ කලාව මේ වන විට යුනෙස්කෝ ලෝක උරුමයක් බවට පත් කර ඇත. තවද 2021

වසරේ දෙසැම්බර් මස 13 සිට 18 දක්වා ප්‍රංශයේ පැරිස් නුවර යුනෙස්කෝ මූලස්ථානයේ පැවති 16 වන අස්පර්ශනීය උරුමයන් සුරැකීම පිළිබඳ අන්තර් රාජ්‍ය සම්මේලනයේදී එවැනි තවත් එක් අස්පෘශ්‍ය උරුමයක් වන ශ්‍රී ලංකාවේ "දුම්බර රටා කලාල" අස්පර්ශනීය ලෝක උරුමයක් බවට පත් කරන ලදී.

- **අමරදේව සංගීත අසපුව ස්ථාපනය කිරීම.**

සංගීත ක්ෂේත්‍රයට අද්විතීය මෙහෙවරක් ඉටු කරන ලද මහා ඝාන්ධර්ව පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව ශූරීන්ගේ ගුණානුස්මරණය මූලික කරගෙන නිර්මාණය වන මෙම සංගීත අසපුවේ කටයුතු බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයෙන් වෙන්කර ගත් පර්චස් 100ක ඉඩම් කොටසක මේ වන විට සිදු කරමින් පවතී. 2021 වර්ෂයේදී සංස්කෘතික කටයුතු අංශය වෙත පැවරුන මෙහි සෞන්දර්යය පර්යේෂණ විද්‍යාගාරයක්, ලේඛනාගාරයක්, පුස්තකාලයක් සහ අමරදේව මහතා විසින් දිනාගන්නා ලද සම්මාන, සහතික සහ එතුමා විසින් පරිහරණය කරන ලද දෑ සුරක්ෂිත කොට අනාගත පරපුරට දායාද කිරීම සඳහා කෞතුකාගාරයක් ද ඉදි කිරීමට කටයුතු කෙරේ.

- **අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය පැවැත්වීම**

කොවිඩ් වසංගත තත්ත්වය යටතේ වුවද අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය - 2021 සඳහා නිර්මාණ කැඳවා විනිශ්චයන් සිදුකොට ජයග්‍රාහකයින් තෝරාගැනීම් කටයුතු අවසන් කර ඇත. 2022 මාර්තු මසදී මෙහි සම්මාන උත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

- **"ප්‍රතිභා" අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය පැවැත්වීම**

පවත්නා කොවිඩ් වසංගත තත්ව යටතේ වුවද 2021 ප්‍රතිභා අන්තර් පළාත් තරග පවත්වා අවසන් කර ඇත.

- **"සංස්කෘතික නුවණ" පුහුණු වැඩමුළුව පැවැත්වීම**

මෙම "සංස්කෘතික නුවණ" පුහුණු වැඩමුළුව අදියර තුනක් යටතේ පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලදි. ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් සඳහා සංස්කෘතික මධ්‍යස්ථානයන්හි 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම පිළිබඳව හා නවක ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන පිළිබඳව අවබෝධය ලබාදීම එම පුහුණු වැඩසටහන් මගින් සිදු කිරීමට හැකි විය. මෙහිදී සංස්කෘතික මධ්‍යස්ථාන මගින් වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාගැනීමට අවශ්‍ය පදනම සකස් කිරීම අරමුණු කර ඇත.

- **"ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය" සැකසීම**

ජාතික වශයෙන් ක්‍රියාත්මක සංස්කෘතික කටයුතුවල සම්බන්ධීකරණයන් හා ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති කිරීම සඳහා ජාතික සංස්කෘතික ප්‍රතිපත්තියක්

අත්‍යවශ්‍ය වේ. මෙය අරමුණු කරගනිමින් ‘‘ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය’’ සැකසීමේ මූලික කටයුතු ආරම්භ කරන ලද අතර විද්වත් කමිටුවක උපදෙස් මත එය ක්‍රියාත්මක වේ. කමිටු නිර්දේශ අනුව මේ වන විට මෙහි මූලික කටයුතු අවසන් කර ඇත.

2.5 අභියෝග හා ඉදිරි ඉලක්ක

	අභියෝග	ඉදිරි ඉලක්ක
1.	ප්‍රාදේශීය වශයෙන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන සංස්කෘතික ක්‍රියාකාරකම් විධිමත් හා මනා සංවිධානයකින් යුතුව ක්‍රියාත්මක කිරීම	• ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන සංස්කෘතික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සඳහා රාජ්‍ය ආයතන පෙළගැස්වීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම
2.	ජාත්‍යන්තර දැනුම හා අත්දැකීම් මුසු කිරීම ඔස්සේ දේශීය කලා ක්ෂේත්‍රයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම	• විදේශීය නාට්‍යකරුවකුගේ සහභාගීත්වයෙන් දේශීය නාට්‍යකරුවන් සඳහා නාට්‍ය වැඩමුළුවක් සංවිධානය කිරීම හා ඔවුන්ට නාට්‍ය නිෂ්පාදනය සඳහා අවස්ථාවන් ලබා දීම
3.	දේශීය සංස්කෘතික හා කලා අංග සංචාරක ව්‍යාපාරය සමග ඒකාබද්ධ කිරීම තුළින් දේශීය කලාව ප්‍රවර්ධනය කිරීම	• වෙස් මුහුණු, කැටයම් ආදී සංචාරක ආකර්ෂණයක් සහිත නිර්මාණ සඳහා රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම • විදේශිකයන් සඳහා බෙර වාදන පුහුණු වැඩසටහන් පැවැත්වීම • දේශීය නර්තන, නාට්‍ය ආදී සම්භාව්‍ය කලා අංග සංචාරක ප්‍රවර්ධනයට යොදා ගැනීම • සංචාරක ව්‍යාපාරය ඉලක්ක කර ගත් ජාතික වැඩසටහනක් ලෙස කොළඹ නගරය ආශ්‍රිතව ජාත්‍යන්තර කලා උලෙළක් සංවිධානය කිරීම • වාර්ෂිකව ජාත්‍යන්තර චිත්‍ර ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම

4.	දේශීය සංස්කෘතික කටයුතු ආශ්‍රිත පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම	• සංස්කෘතික මධ්‍යස්ථානවල පරිපාලන, මූල්‍ය හා සංස්කෘතික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දීම • නව සංස්කෘතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම ගොඩනැංවීම • සංස්කෘතික ක්ෂේත්‍රයට අදාළ ආයතන ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම • සංස්කෘතික ක්ෂේත්‍රයට අදාළ පනත්, ව්‍යවස්ථා හා රෙගුලාසි යාවත්කාලීන කිරීම. • සංස්කෘතික ක්ෂේත්‍රයට අදාල බදු ප්‍රතිපත්තිය විමර්ශනය කිරීම
5.	දේශීය සංස්කෘතික කලා පරිභෝජනයේ ක්‍රමවත් හා විධිමත් භාවය ඉහළ නැංවීම	• සංස්කෘතික කලා පරිභෝජනය ඉහළ නැංවීම පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම • සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රය පිළිබඳ පාසල් පාඨ ග්‍රන්ථ යාවත්කාලීන කිරීම සඳහා යෝජනාවලියක් ගොඩනැගීම
6.	හඳුනාගත් දේශීය සාම්ප්‍රදායික සංස්කෘතිකාංගවල පවතින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම	• සංස්කෘතික මධ්‍යස්ථාන හරහා දේවාල ආශ්‍රිත ශාන්තිකර්ම කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ හඳුනාගැනීම හා බලපත්‍ර නිකුත් කිරීම
7.	දේශීයව නිර්මාණය වන උසස් කලා කෘති ප්‍රාදේශීයව ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාවන් පුළුල් කිරීම ඔස්සේ වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනයක් ඇති කිරීම	• තෝරාගත් දිස්ත්‍රික්කවල ප්‍රාදේශීයව පවතින රංග ශාලා නවීකරණය කිරීම

8.	සංස්කෘතික මධ්‍යස්ථාන මගින් නිර්මාණය වන උසස් කලා කෘති සඳහා ප්‍රදර්ශන අවස්ථාවන් පුළුල් කර දීම	• සංස්කෘතික මධ්‍යස්ථාන මගින් කෙටි නාට්‍ය නිෂ්පාදනය කිරීම හා ඒවා ප්‍රදර්ශනය කිරීම • සංස්කෘතික මධ්‍යස්ථාන මගින් නිර්මාණය කරනු ලබන දේශීය සම්භාව්‍ය කලා නිර්මාණ නාගරික අවකාශය තුළ ප්‍රදර්ශනය කිරීම
9.	ශ්‍රී ලාංකික ජනතාවගේ සංස්කෘතික රසවින්දනය ඉහළ නැංවීම හා වඩා පුළුල් සංස්කෘතියකින් යුත් මිනිසෙකු නිර්මාණය කිරීම සඳහා සම්භාව්‍ය කලා සම්ප්‍රදායන් ඔස්සේ සංගීත ක්ෂේත්‍රයේ නව ප්‍රගමනයක් ඇති කිරීම	• ඔපෙරා, බැලේ, සංගීත සංධ්වනි හා සංගීත නාටක ආදී නව කලා සම්ප්‍රධායන් හදුන්වා දීම
10.	පාඨකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි ග්‍රන්ථ නිර්මාණ ක්ෂේත්‍රයට නවීන තාක්ෂණික ක්‍රම හදුන්වා දෙමින් එම ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම	• දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් ශ්‍රව්‍ය ග්‍රන්ථ නිෂ්පාදනය කිරීම
11.	කියවීමේ රුචිය ඉහළ නැංවීම තුළින් ග්‍රන්ථ නිර්මාණ ක්ෂේත්‍රයේ නව පිබිදීමක් ඇති කිරීම	• පළාත් පොත් ප්‍රදර්ශන සංවිධානය කිරීම

ඉහත පිටු අංක 89 සිට 111 දක්වා පිටු වලින් දක්වා ඇති තොරතුරු පරීක්ෂා කර බලා ඇති බවත්, එම සංඛ්‍යා සමග එකඟවන බවත් මෙයින් සහතික කරමි.

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

නම - දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන

තනතුර - ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දිනය - 2022.02.24

පරිච්ඡේදය 03 - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වසරේ

සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ඒසිඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2021		සටහන	තක්සා 2,021	2,020	
	ආදායම් ලැබීම්				
	ආදායම් බදු	1	-	-	
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අග්‍රිම		720,024,000	877,424,000	ඒසිඒ-3
	කැන්පතු		5,581,725	5,462,163	ඒසිඒ-4
	අත්තිකාරම් ගිණුම්		34,564,048	10,813,436	ඒසිඒ-5/5(අ)
	වෙනත් ලැබීම්				
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**760,169,773**	**893,699,599**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**760,169,773**	**893,699,599**	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
580,600,000	වේතන,වැටුප් සහ අනෙකුත් සේවක	5	531,406,736	545,982,411	
221,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	133,485,062	167,721,279	ඒසිඒ-2(ii)
149,600,000	සහනාධාර,සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම්	7	131,718,037	141,639,678	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	1,200	36,300	
951,200,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**796,611,035**	**855,379,667**	
	මූලධන වියදම්				
12,650,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	8,896,434	18,502,697	
161,850,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	96,358,800	78,939,018	
40,000,000	ප්‍රාග්ධන පැවරීම්	12	10,984,000	15,000,000	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,500,000	හැකියා වර්ධනය	14	614,658	616,387	
29,000,000	වෙනත් මූලධන වියදම්	15	5,935,767	30,705,554	
245,000,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**122,789,659**	**143,763,655**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**51,936,456**	**133,665,760**	
	කැන්පතු ගෙවීම්		17,698,529	6,127,159	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		34,237,927	127,538,601	ඒසිඒ-5/5(අ)
1,196,200,000.00	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		**971,337,150**	**1,132,809,082**	
(1,196,200,000.00)	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**(211,167,378)**	**(239,109,484)**	

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 . රු
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	3,415,278,892	3,321,770,092
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(අ)	116,399,044	116,725,165
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**3,531,677,936**	**3,438,495,257**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		81,940,807	70,150,124
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,415,278,892	3,321,770,092
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(ආ)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	34,458,237	46,575,041
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**3,531,677,936**	**3,438,495,257**

පිටු අංක 112සිට 114 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 115 සිට 118 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකග වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	තනතුර : අජිතා කුමාරි ලක්ෂ්මන් ප්‍රධාන ගණකාධිකාරි
දිනය : 2022.02.24	දිනය :	දිනය : ඉඩකඩ, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය 5 වන මහල "සෙත්සිරිපාය" බත්තරමුල්ල.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2021	නැවත ගලපන ලද 2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	39,821,403	32,771,181
අග්‍රිම ලැබීම්	720,024,000	877,424,000
අත්තිකාරම් අයකර ගැනීම්	34,218,570	118,918,176
තැන්පතු ලැබීම්	5,581,725	5,462,163
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**799,645,698**	**1,034,575,520**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	671,478,753	721,177,009
සහනාධාර සහ මාරුකිරීම්	30,045,237	47,539,679
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	32,659,711	105,080,922
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	34,320,327	131,510,814
තැන්පතු ගෙවීම්	17,698,529	6,127,159
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**786,202,558**	**1,011,435,582**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**13,443,140**	**23,139,938**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	13,443,140	23,139,938
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**13,443,140**	**23,139,938**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(13,443,140)**	**(23,139,938)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	0	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන් 05 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පුද්ගල පඩිනඩි	65,600,000	-	-	65,600,000	49,466,944	515,000,000	-	-	515,000,000	481,939,793	**531,406,736**

සටහන් 06 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
ගමන් වියදම්	3,000,000	-	(250,000)	2,750,000	869,035	7,500,000	-	-	7,500,000	2,021,697	2,890,732
සැපයීම්	9,000,000	-	-	9,000,000	8,112,000	10,000,000	-	500,000	10,500,000	7,306,918	15,418,918
නඩත්තු වියදම්	6,900,000	-	750,000	7,650,000	4,800,940	3,700,000	-	-	3,700,000	2,421,376	7,222,316
සේවා	62,800,000	-	2,605,800	65,405,800	62,998,724	118,100,000	-	(7,857,000)	110,243,000	44,954,372	107,953,096
											133,485,062

සටහන් 07 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මාරුකිරීම්	109,600,000	-	-	109,600,000	103,681,270	40,000,000	-	-	40,000,000	28,036,767	131,718,037

සටහන් 09

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පාඩු හා කපා හැරීම්	-	-	1,200	1,200	1,200	-	-	-	-	-	**1,200**

සටහන් 10 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.ගෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මූලධන වත්තකම් පුන රුත්තරාපනය හා වැඩිදියුණු කිරීම්	3,450,000	-	-	3,450,000	2,400,136	9,200,000	-	-	9,200,000	6,496,298	**8,896,434**

සටහන් 11 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය					මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	8,850,000	-	4,250,000	13,100,000	9,250,592	153,000,000	-	-	153,000,000	87,108,208	96,358,800

සටහන් 12 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය					මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
ප්‍රාග්ධන මාරුකිරීම්	40,000,000	-	-	40,000,000	10,984,000	-	-	-	-	-	10,984,000

සටහන් 14 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය					මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
සටහන් **13** - මූල්‍ය වත්කම් පත් කර ගැනීම	-			-	-	-	-	-	-	-	-
සටහන් **14**- හැකියා වර්ධනය	1,500,000	-	-	1,500,000	614,658	-	-	-	-	-	614,658

සටහන් 15 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය					මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ඉදිරිපත් ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
වෙනත් මූලධන වියදම්	-	-	-	-	-	29,000,000	-	(174,800)	28,825,200	5,935,767	5,935,767

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - නැත

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	951,200	946,950	796,611	84
ප්‍රාග්ධන	245,000	249,250	122,790	49

3.8. මු.රෙ.208 ප්‍රාකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජීයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජනමාධ්‍ය අමාත්‍යාංශය (105-01-03-03-2205)	අමරදේව අසපුව ඉදිකිරීම	150,000	150,000	18,218	12
2	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (130-01-02-0-1003)	උපාධිධාරී අභ්‍යාසලාභී දීමනා ගෙවීම් කිරීම	980	980	949	97
3	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව (253-01-02-04-1502-12)	විශ්‍රාම වැටුප් පාරිතෝෂික නිරවුල් කිරීම	1,350	1,350	1,350	100
4	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (බුද්ධශාසන අංශය) - (101-01-01-0-1409)	අමාත්‍ය කාර්යාලයේ සංග්‍රහ වියදම් සඳහා	60	60	45	75
5	රාජ්‍ය ආරක්ෂක ,ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය (409-01-05-0-1409-67)	73 වන නිදහස් සමරු උළෙල සංස්කෘතික සංදර්ශනය ඉදිරිපත් කිරීම සඳහා	12,260	12,260	12,098	99
			164,650	**164,650**	**32,660**	

3.9මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය					
					රු. '000
වත්කම් කේතය	**කේත විස්තරය**	**31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය**	**31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය**	**ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත**	**ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම**
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,967,548	2,967,548		
9152	යන්ත්‍රෝපකරණ	279,655	279,655		
9153	ඉඩම්	168,076	168,076		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	-		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඒඒ/සි/එම්ඕබී/2/2021/02 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 මැයි 31 දින

ලේකම්,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක

කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ බුද්ධශාසන අංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.3	2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ වූ කොන්ත්‍රාත් සඳහා වූ මුළු රැඳවුම් මුදල් ශේෂය රු.99,596,333 ක් වූ අතර ඒ තුළ වූ බුද්ධශාසන අංශයට අදාළ රැඳවුම් මුදල් ශේෂය රු.57,343,077 ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් වර්ෂ 02 ඉක්මවූ රු.1,789,359 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු බව.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

(අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය විසින් 2021 මැයි 05 දින බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලද රු.2,500,000 ක් පිරිවැය වූ PA-2741 අංක දරන ඩබල් කැබ් රථයේ වටිනාකම් මූල්‍ය නොවන වත්කම් තුල වාහනවල වටිනාකමට ඇතුළත් කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් වැඩියෙන් පෙන්වා තිබුණු අතර අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබාගෙන ඇති ජල හා ජල ප්‍රවාහන අමාත්‍යාංශය සතු KE-9331 අංක දරන රු.6,000,000 ක් වටිනා ජීප් රථය මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර තිබුණි. තවද, PA-7974 හා 18-4263 අංක දරන වාහන 02 හි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සතුව වාහන 50 ක් පැවති අතර 2021 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA(06) ආකෘතිය අනුව වාහන 19 ක වටිනාකම් රු.71,350,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි වාහන 31ක වටිනාකම් ඇතුලත්ව නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
(i) ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891(1)	බුද්ධශාසන අංශය විසින් පවත්වා නොතිබුණු අතර සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි.
(ii) හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110	බුද්ධශාසන අංශය විසින් පවත්වා නොතිබුණි
(iii) බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 211(1) සහ 447	සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි.
(iv) චෙක්පත් භාරදීමේ ලේඛන	මුදල් රෙගුලාසි 388 (1) සහ 389	සංස්කෘතික අංශය විසින් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමණාකරනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, පුනරාවර්ථන වැය විෂයයන් 13 ක් සඳහා සියයට 12 සිට සියයට 100 දක්වා ද මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සියයට 43 සිට සියයට 100 දක්වා ද පරාසයක මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවයන් පැවතුණි.

2.2 ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වෙන්කර තිබුණු රු.2,237,990,300 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.547,781,659 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 24.48 කි. ඒ අනුව පුනරාවර්තන වැය විෂයයන් 13 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.236,418,200 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 84 දක්වා වූ පරාසයකට අයත් රු.120,009,261 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

2.3 මු.රෙ. 66 යටතේ මාරුකරන ලද ප්‍රතිපාදන ඉතිරිවීම

ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ පුනරාවර්ථන වැය විෂයයන් 03කට රු.9,545,000 ක ප්‍රතිපාදන මාරු කර තිබුණු අතර ඉන් සියයට 23 සිට සියයට 91 දක්වා පරාසයකට අයත් රු.5,394,762 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

2.4 පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිය

මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව වැය විෂයයන් 03 ක් සඳහා ලබා ගන්නා ලද පරිපූරක ප්‍රතිපාදන වලින් වැය විෂයයන් දෙකක් සඳහා වූ රු.5,914,300 ක ප්‍රතිපාදන සියයට 100 ක් උපයෝජනය නොකර තිබුණු අතර එක් ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ලබා ගත් රු.66,000,000 ක පරිපූරක ප්‍රතිපාදනයෙන් සියයට 82ක් ඉතිරිකර තිබුණි.

2.5 බැරකම් හා බැදීම්වලට එළඹීම

සියළුම බැරකම් සිදුවූ වහාම සටහන් කර ගත යුතු වුවද, සංස්කෘතික අංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ඒ හේතුවෙන් ගිණුම් සමඟ ඉදිරිපත් කර තිබූ බැරකම් හා බැඳීම් ප්‍රකාශනය අනුව එකතුව රු.46,300,546 ක් වූ බැරකම් හා රු.10,692,125 ක් වූ බැඳීම් නිවැරදි බවට විගණනයේදී තහවුරු කරගත ෙ: ි විය.

2.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීමට හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.3 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි

2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදය	
(i) 4.2.5, 4.5 හා 4.6 උප වගන්ති	බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.167,055 ක ණය ශේෂය වර්ෂ 02 කට වැඩි කාලයක සිට ද සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.128,732 ක ණය ශේෂය වර්ෂ

	05 කට වැඩි කාලයක සිට ද අයවිය යුතුව පැවති අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සංස්කෘතික අංශයේ මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.101,300 ක ණයශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ii) 4.2.3 උප වගන්තිය සහ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/08පොදු(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය	බුද්ධශාසන අංශයේ වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකුගේ රු.32,155 ක ණය ශේෂය වර්ෂ 04 කට වැඩි කාලයක සිට ද සංස්කෘතික අංශයේ වැඩතහනම් කර ඇති නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.654,712 ක් වූ ණය ශේෂය වර්ෂ 03 ක සිට අයවිය යුතුව පවතින අතර පියවාගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 113(4)	මුදල් රෙගුලාසි 109 යටතේ වන සංස්කෘතික අංශයේ පාඩු ලෙස කපා හැර ඇති රු.25,000 ට අඩු සිද්ධීන් 23 ක අගය ලෙස රු.114,256 ක් ගිණුම් සමඟ ඉදිරිපත් කල සටහන (ii) මඟින් දක්වා තිබුණද ඊට අදාල නියෝග වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 371(5)	2021 වසරේ ජාතික නිදහස් දින උළෙල වෙනුවෙන් සංස්කෘතික මධ්‍යස්ථාන භාරකරුවන් වෙත ලබාදී තිබූ රු.25,000 බැගින් වූ එකතුව රු.125,000 ක පුද්ගල අත්තිකාරම් 5ක් කාර්ය අවසන් වී මාස 03ක් ගතවූ පසු පියවා තිබුණි.
(iii) මුදල් රෙගුලාසි 386(7) සහ 394(ආ)	සංස්කෘතික අංශය විසින් නිකුත් කර අවලංගු වූ රු.39,500 ක චෙක්පත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 756(6)	සංස්කෘතික අංශයේ 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ප්‍රධාන ගබඩාවේ තොග සමීක්ෂණ වාර්තා විගණිත දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රවර්ධන අංශයට අයත් නර්තන ඇඳුම් ගබඩාවේ පැවති භාණ්ඩ කිසිදු අවස්ථාවක සමීක්ෂණයට භාජනය කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 1647	අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සතු වාහන 31 ක් සම්බන්ධයෙන් හා සංස්කෘති අංශය සතු වාහන සහ උපකරණ සම්බන්ධයෙන් සමීක්ෂණයන් කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාර්ගෝපදේශ සංග්‍රහය	
(i) මාර්ගෝපදේශ 3.2	ඇස්තමේන්තු අගය පිළිවෙලින් රු.20,009,609 ක්, රු.14,665,744 ක් හා රු.15,165,683 ක් වූ බමුණාකොටුව, මාවතගම හා පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කොන්ත්‍රාත් තරහකාරී මිල ගණන් කැඳවීමෙන් තොරව ආයතන 05 කින් සීමිත මිල ගණන් කැඳවා සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පුද්ගලික සමාගමට පවරා තිබුණි. තවද, සීමිත මිල ගණන් කැඳවූ ආයතන තෝරා ගැනීම, විනිවිදභාවයකින් යුතුව සිදු කර නොතිබුණි.
(ii) මාර්ගෝපදේශ 3.2.2 (ඇ) හා 3.10.1, 7.8 (අ)	උක්ත සඳහන් කොන්ත්‍රාත්කරුට ICTAD ලියාපදිංචිය පවතීද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉහත කොන්ත්‍රාත් 03 එකවර පවරා තිබුණද ඊට අවශ්‍ය සම්පත් හා කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත්කරු සතුව පවතීද යන්න සලකා බලා නොතිබුණි.
(iii)මාර්ගෝපදේශ 5.4.8 (අ)	පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාල කාර්යසාධන සුරක්ෂණය දින දීර්ඝ කර ලබාදී නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම නිම නොකිරීමෙන් වූ අලාභය පියවා ගැනීමට නොහැකිව තිබුණි.
(iv) මාර්ගෝපදේශ 8.12.2	පොල්ගහවෙල හා බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම්වලට අදාල වැඩ අවසන් කිරීමේ සහතික උපදේශක විසින් නිකුත් කර නොතිබුණි.
(v) මාර්ගෝපදේශ 8.13.4	පොල්ගහවෙල හා බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානයවල ඉදිකිරීම්වලට අදාල පිළිවෙලින් රු.2,195,881 හා රු.5,555,662 ක් වූ අමතර වැඩ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර නොතිබුණි.

(vi) මාර්ගෝපදේශ 8.14	මාවතගම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු ඉල්ලා තිබුණද දීර්ඝ කිරීම් ලබාදී නොතිබූ අතර ඊට අදාලව ගෙවා තිබූ රු.8,484,290 ක ගෙවීමෙන් සියයට 1 ක් වූ ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.
(ඇ) 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය	
(i) 02 ඡේදය	සංස්කෘතික අංශයේ විශ්‍රාමික සේවකයන් 3 දෙනෙකුට අදාල රු.180,890 ක ණයශේෂ අයකරගෙන නොතිබුණි.
(ii) 04 හා 06 ඡේද	2019 වර්ෂයේ මියගිය සහ මරණ පාරිතෝෂික ලබාදී තිබූ සංස්කෘතික අංශයේ එක් සේවකයෙකුට අදාල රු.5,000 ක ණය ශේෂයක් අත්තිකාරම් "බී" ගිණුමේ පැවතුණි.
(ඉ) 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	
(i) 03(ඉ) ඡේදය	සංස්කෘතික අංශයේ සේවය අතහැරගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.479,268 ක් වූ ණයශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) 03,04,05 ඡේද	සංස්කෘතික අංශයේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ වසර ගණනාවක සිට පැවත එන රු.1,426,148 ක් වූ ශේෂ ගලපා තිබූ අතර එම ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඊ) 2004 දෙසැම්බර් 22 දිනැති අංක: අමප/04/1012/042/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	සංස්කෘතික මධ්‍යස්ථානවල සංස්කෘතික නිලධාරී, සහකාර සංස්කෘතික නිලධාරී, කාර්යාල කාර්ය සහායක සහ මුරකරු යන තනතුරු 04 සඳහා සේවකයින් 04ක් පමණක් අනුයුක්ත කළ යුතු වුවද ඊට පටහැනිව සංවර්ධන නිලධාරීන්ද අනුයුක්ත කර තිබුණි. තවද, සේවකයින් 04 ඉක්මවා 10 දක්වා සේවය කරන මධ්‍යස්ථාන පැවති අතර සේවක පුරප්පාඩු පැවති මධ්‍යස්ථානද විය. ඒ අනුව

		මධ්‍යස්ථාන සඳහා අවිධිමත්ව සේවකයින් අනුයුක්ත කර තිබූ බව නිරීක්ෂණය විය.
(එ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය	ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුල රැහුම්පාලක පනත යටතේ මහජන ප්‍රදර්ශන සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තු 2015 ජූලි මස 15 දිනට පසු සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඒ)	1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	(i) 1952 ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩල ආඥා පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා චිත්‍රපට, DVD හා කෙටිකතා සමීක්ෂණය සඳහා 2021 වර්ෂයේදී මණ්ඩලයේ සාමාජිකයන් 15 දෙනෙකුට භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, රු.811,250 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. (ii) ආඥා පනතේ 5(1) හා 6(1) වගන්ති ප්‍රකාර සහතිකපත්‍ර නිකුත් කිරීමේ සහතික කරන බලධාරියා ලෙස මණ්ඩලයේ සභාපතිවරයා කටයුතු කරනු ලබන අතර සභාපතිවරයාගේ මාසික දීමනාව ලෙස රු.75,000 ක් ගෙවනු ලබයි. ඒ අනුව සභාපතිවරයාගේ සාමාන්‍ය රාජකාරියෙන් කොටසක් ලෙස ගැනෙන චිත්‍රපට, නාට්‍ය හා DVD නැරඹීම/සමීක්ෂණය සඳහා 2021 වර්ෂය තුලදී රු.103,500 ක් සභාපතිවරයාට ගෙවා තිබුණි.
(ඔ)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	(i) සංස්කෘතික මධ්‍යස්ථානවල පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දී නොතිබුණි. (ii) මධ්‍යස්ථාන සේවකයින්ගේ මාසික පැමිණීම්, පිටවීම්, නිවාඩු හා කෙටි නිවාඩු පිළිබඳ විස්තර ඇතුලත් වාර්තාවක් මාසිකව අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබූ අතර සේවක පැමිණීම්, පිටවීම් හා නිවාඩු සැලකිල්ලට ගැනීමෙන් තොරව මාසික වැටුප් ගෙවා තිබුණි.

(iii) මධ්‍යස්ථානවල ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් නිවාඩු ලබාගන්නා අවස්ථාවල කටයුතු කල යුතු ආකාරය පිළිබඳ නිශ්චිත උපදෙස් ලබාදී නොතිබුණි.

(ඕ) 2014 ජුනි 26 දිනැති අංක 5/2014 (i) දරන සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය

සංස්කෘතික මධ්‍යස්ථානවල පිහිටුවන ලද සංවර්ධන සංගම් සඳහා විධිවිධාන පරිදි නිලධාරීන් පත් කර ගැනීමට, පොත්පත් පවත්වා ගැනීමට, මාස 03 කට වරක් ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට හා අභ්‍යන්තර විගණනයට ලක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සංවර්ධන සංගම්වල ආදායමෙන් අනුමත වියදම් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල් සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳ නිශ්චිත උපදෙස් ලබාදී නොතිබුණි.

2.8 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි 1644(11) පරිදි මෝටර් වාහනයක් පුද්ගලික වැඩපලකදී අලුත්වැඩියා කර ගැනීමේදී එක් එක් වැඩය වෙනුවෙන් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද රු.839,370 ක් වැයකර අවස්ථා 7කදී සිදුකල අලුත්වැඩියා වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්කෘතික මධ්‍යස්ථානවල සේවකයින්ගේ රාජකාරී වේලාවන්, 2016 මාර්තු 21 දිනැති අංක 03/2006 දරන ප්‍රවර්ධන චක්‍රලේඛය මගින් සාමාන්‍ය රාජකාරී වේලාවෙන් වෙනස් කර තිබුනද ඒ සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) සංස්කෘතික මධ්‍යස්ථානවල පිහිටුවා තිබූ සංවර්ධන සංගම් සඳහා, සංවර්ධන සංගම් අරමුදල් පිහිටුවීම සඳහා සහ මධ්‍යස්ථාන වල අයකරන පාඨමාලා ගාස්තු, පුස්ථකාල සාමාජික ගාස්තු සහ පෙර පාසල් දායක මුදල් වැනි අයකිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොතිබුණි. අදාල අයකිරීම් අමාත්‍යාංශයේ ආදායම් ලෙස ගෙන නොතිබූ අතර සංස්කෘතික මධ්‍යස්ථානවල කටයුතු සඳහා එම ආදායම් වැයකිරීමට අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් අනුමැතිය ලබා දී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 සාහිත්‍ය කලා උළෙල පැවැත්වීම සඳහා 2021වාර්ෂික අයවැය මගින් රු.මි.18.70 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද වර්ෂය තුළ එම වැඩසටහන පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සවිකිරීම සඳහා අයවැය මගින් රු.4,000,000 ක වාර්ෂික ප්‍රතිපාදන ලබාදී තිබුණද මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම.

රු.මිලියන 1350 ක (අදියර 1-5 දක්වා) මුලික ඇස්තමේන්තුවක් මත 2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05 ක් දක්වා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1245.18 ක පිරිවැයක් දරා තිබුණු අතර 2021 වර්ෂයේ ආරක්ෂක සේවා හා විදුලි බිල්පත් පියවීම් සඳහා රු.මිලියන 2.72 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් අවසන් කර විද්‍යාලංකාර භාරය වෙත භාරදීමෙන් පසුව ගොඩනැඟිල්ල බදු දීමෙන් ලැබෙන ආදායමෙන් මෙම ව්‍යාපෘතියේ vi වන අදියර ඉදිකිරීම සඳහා එකඟවී ඇති බව පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ විසින් දන්වා තිබූ නමුත් මෙතෙක් ගොඩනැඟිල්ල විද්‍යාලංකාර භාරය වෙත පැවරීම සඳහා කටයුතු කර නොතිබුණි.

ඒ අනුව ගොඩනැඟිල්ලේ v වන අදියරේ කටයුතු 2019 මාර්තු 15 දින වන විට අවසන් කර තිබුණද vi අදියරේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය සහ ආරක්ෂක වියදම් දරමින් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය කෙරේ.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) තිරසර පුණ්‍යාග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක කළුතර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන හා දහම්පාසල් 04 ක් සඳහා පුස්තකාල පහසුකම් සැපයීම වෙනුවෙන් රු.530,000 ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එම ප්‍රතිපාදන වෙන්කර මාස 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් අදාල උපකරණ දහම්පාසල් වෙත ලැබී නොතිබුණි.

(ආ) මාවතගම, බමුණාකොටුව හා පොල්ගහවෙල යන සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම්වලට අදාල කොන්ත්‍රාත්තු පිළිවෙලින් රු.14,665,744 කට රු.19,999,732 කට හා රු.11,086,971 කට 2016 වසරේ සමාගමකට පවරා තිබුණි. අදාල ඉදිකිරීම් පිළිවෙලින් 2016 දෙසැම්බර් 25, 2016 දෙසැම්බර් 23 හා 2017 ජනවාරි 03 යන දිනවල නිමකල යුතු වුවද 2021 දෙසැම්බර් දක්වා අදාල ඉදිකිරීම් නිමකර ගොඩනැඟිලි භාර දී නොතිබුණි.

3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) බෞද්ධ විශ්වකෝෂය අන්තර්ජාල ගත කිරීම.

බෞද්ධ විශ්ව කෝෂය අන්තර්ජාල ගත කිරීමේ කාර්යය සඳහා අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද රු.මිලියන 6 ක ප්‍රතිපාදන මුදල් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අයත් කටයුත්තක් ලෙස 2021 ජුනි 29 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එසේ වුවද, එම ප්‍රතිපාදනවලින් අපේක්ෂිත කාර්යය ඉටුකිරීම සඳහා 2022 වර්ෂයේ ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් 2021 සැප්තැම්බර් 09 වන දින නැවත එම ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණු අතර වර්ෂය අවසාන වන විටත් අදාල වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් තොරව ප්‍රතිපාදන මුදල් නැවත භාණ්ඩාගාරය වෙත යාවා තිබුණි.

(ආ) රු.21,383,325 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබූ උහණ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2015 වර්ෂයේ සිට 2021 දක්වා වරින් වර රු.40,047,970 ක ප්‍රතිපාදන අමිපාර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණද, ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර නොතිබුණි.

3.1.5 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්

සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් 2008 ඔක්තෝබර් 29 දිනැති අංක CH/26/2008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2009 පෙබරවාරි 12 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2008 නොවැම්බර් 17 දින අංක PV 66112 යටතේ ලියාපදිංචි කර තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති ස්වකීය කොටස්වලින් සියයට 50 ක් හෝ වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් විසින් හෝ දරනු ලබන සමාගම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු වුවද අමාත්‍යාංශයේ පූර්ණ නිමිකාරිත්වය සතු මෙම සමාගමේ 2018/2019, 2019/2020 හා 2020/2021 යන මූල්‍ය වර්ෂ වලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අදාල සමාගම පිහිටුවා ඇත්තේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු බාහිර ආයතන ලවා ඉටුකරවා ගැනීමේදී සිදුව තිබූ අපහසුතා හා ගැටලු මහහරවා ගැනීම පිණිස වුවද සමාගම විසින් 2009 සහ 2010 කාල සීමාව තුළ භාරගන්නා ලද, අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල ඉදිකිරීම්, 5% ක පමණ ආන්තිකයක් තබාගෙන උප කොන්ත්‍රාත්කරුවන්ට පවරා ඉටුකරවා ගැනීම තුළ එම අපහසුතා හා ගැටලු තවදුරටත් සිදුව තිබුණි.

(ඇ) වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ අනුව පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ අනුකූල වන බවට දක්වා තිබූ අවශ්‍යතා 11 ක් අනුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්කෘතික අංශය සතු වාහන 16 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදාහැර තිබුණද එම මාරු කිරීම් හා පැවරීම් සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසෙහි 8.1 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්කෘතික අංශය සතු අපහරණය කල යුතුව පැවති වාහන 06 ක් සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 (ආ) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද විගණන විමසුම් **1ක්** සඳහා පිළිතුරු මෙම වාර්තාවේ දිනය වන විටත් ලබා දී නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) රු.මිලියන 312.49 ක් වැය කර ඉදිකර තිබූ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ වර්ග අඩි 33547ක විශාල ඉඩකඩ ප්‍රමාණයක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණද අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිවෙලින් රු.4,200,000 ක හා රු.6,816,000 ක කුලියකට වාර්ෂික කුලි පදනම මත පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වා ගෙන යමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් 2020 විගණන වාර්තාවේ ද සඳහන් කර තිබූ නමුත් ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) නාගදීප විහාරස්ථානයේ සංවර්ධන කටයුතු

වෙසක් උත්සවය පැවැත්වීමට සැලසුම් කර තිබූ යාපනය දිස්ත්‍රික්කයේ විහාරස්ථානවලට අදාලව සිදුකරන ලද ප්‍රතිසංස්කරණ සඳහා නාගදීප විහාරස්ථානය සඳහා රු.12,736,743 ක මුදලක් වැය කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විහාර මන්දිරය ප්‍රතිසංස්කරණය

විහාර මන්දිරයේ ජලකාන්දුව වැළැක්වීමට අවශ්‍ය ක්‍රමවේද අනුගමනය කර පිපිරීම් සිදු වී ඇති ස්ථාන සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කර ජලය කාන්දුවීම වළක්වන තීන්ත 3 වරක් ආලේප කිරීමට සහ තවත් කාර්යයන් කිහිපයක් ඉටු කිරීම සඳහා රු 4,500,888 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර විගණිත දිනය වූ 2022 පෙබරවාරි 19 වන විටත් ජලකාන්දු වීම් සිදුවෙමින් පවතින බවත් දියසෙවල බැඳී ඉහළ කොටසේ පැත්තක් හානි වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.

(ii) පොත්ගුල් විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.

පොත්ගුල් විහාරයේ අත්වැට ඉදිකිරීම හා අමතර නිම කිරීම් සඳහා රු.මිලියන 1.7 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණද දාළ කාර්යයන් ඇස්තමේන්තු කර නොතිබීම හේතුවෙන් එක් කණුවකට රු.3,500 බැගින් බිරළු කණු 87 ක් සඳහා වූ රු.304,500 ක වියදම් විහාරාධිපති ස්වාමීන් වහන්සේට දැරීමට සිදුවී තිබුණි. ප්‍රතිපාදන මුදලට අමතර තවද, විහාර ගෙයි බිම සහ පොළව අතර නිමාව නියමිත පරිදි සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(iii) විදේශීය බැතිමතුන් සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.

මෙම කාර්යය සඳහා රු.1,834,946 ක මුදලක් අනුමත කර තිබූ අතර ඉදිරිපස බිත්තියේ විදුරු ගල් යෙදීම සහ වැසිකිළි පද්ධතියේ වහළ මත ජල කාන්දුව වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(iv) දේශීය බැතිමතුන් සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම

මෙම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව රු.1,834,946 ක් වූ අතර වැසිකිළි වහළයේ ජල කාන්දුවීම් වැලැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, වැසිකිළි පරිශ්‍රය අවට ජලය මඟින් අපවිත්‍ර වී මඩ වීම වැළැක්වීම උදෙසා සිමෙන්ති ගල් ඇතිරීම විහාරාධිපති ස්වමීන්වහන්සේගේ දායකත්වයෙන් සිදුවී තිබුණි.

(v) වැසිකිළි ආවරණ තාප්පය ඉදිකිරීම.

වැසිකිළි පද්ධතියේ ආරක්ෂාව සඳහා මෙම තාප්පය ඉදිකිරීමට රු.908,810 ක ප්‍රතිපාදන සලසා තිබුණද තාප්පය නිම කිරීමෙන් පසු ගේට්ටුවක් යෙදීම විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ දායකත්වයෙන් සිදු කර තිබුණි.

(vi) විහාර භූමියේ ඇති විශාල ගස් වටා කළුගල් ආවරණ බැමි ඉදිකර තිබුණද එම ඉදිකිරීම් වල ඉරි තැලීම් පැවති අතර කළු ගල් තාප්පය වටා කපරාරු සිදු කර නොමැති බැවින් එහි කල් පැවැත්ම අවිනිශ්චිත විය.

(vii) කොවිඩ් මර්ධන මාර්ගෝපදේශ අනුව රාජ්‍ය වෙසක් උත්සවය අවලංගු කර තිබුණද විහාරයට ඇතුළුවන ස්ථානයේ තාවකාලික තොරණක් ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.475, 000 ක මුදල නාවික හමුදාව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(viii) වෙසක් උත්සවය සඳහා සකස් කිරීමට නියමිතව තිබූ වේදිකාව සඳහා අවශ්‍ය රෙදි ආවරණ (canopy) වෙනුවෙන් රු. මිලියන 1.02 ක මුදලක් නාවික හමුදාව වෙත නිදහස් කර තිබුණි. කොරෝනා වසංගතය හේතුවෙන් වෙසක් උත්සවය අවලංගු වුවද, අදාල මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) උක්ත සඳහන් සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය මාසිකව වාර්තා කරන ලෙස නාවික හමුදාපති දැනුවත් කර ඇතත් ප්‍රගතිය සමාලෝචනය කළ බවට හෝ ප්‍රගති වාර්තා ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) වාහන අලුත්වැඩියා කිරීමේදී ටෙන්ඩර් පිළිබඳ සාමාන්‍ය නියෝග අදාල කරගත යුතු වුවද, අංක WP PB– 6252 දරන මෝටර් රථය අලුත්වැඩියා කිරීමේදී මුදල් රෙගුලාසි 1644 (IV) අනුව කටයුතු නොකර 2017 නොවැම්බර් මාසයේදී පුද්ගලික සමාගමක් වෙත සෘජුවම අලුත්වැඩියාව පවරා තිබුණි. අදාල සමාගම විසින් රථය පරීක්ෂා කිරීමේ ගාස්තු හා වාහනය නවතා තැබීමේ ගාස්තු ලෙස දිනකට රු.500 බැගින් ගෙවන ලෙස 2020 වසරේදී දන්වා තිබුණද මේ පිලිබඳ අවධානය යොමු කර නොතිබීම නිසා අදාල වාහනය ඉක්මනින් හා අඩු පිරිවැයකින් අලුත්වැඩියා කර ධාවනයට එක් කර ගැනීමට නොහැකිව තිබූ අතර අදාල මඟින්ම සමාගම රු.1,258,981 ක් වැය කරමින් අලුත්වැඩියාව සිදු කර ගැනීමට සිදු වී තිබුණි.

(ඇ) අන්තර් රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය-2020 සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත රු.328,800 ක් (VAT සහිත) ගෙවා ඉහත තරඟාවලියේ ජයග්‍රාහී නිර්මාණ ඇතුලත් කරමින් "ප්‍රභාෂ්වර" නමින් ග්‍රන්ථයක පිටපත් 300 ක් මුද්‍රණය කර තිබූ අතර ග්‍රන්ථය මුද්‍රණය කර අමාත්‍යාංශය වෙත භාරදී තිබුණේ සම්මාන ප්‍රදානෝත්සවය අවසන් වී මාස 04 කටත් පසුව බැවින් ග්‍රන්ථය 2021 මාර්තු 18 දින පැවති සම්මාන ප්‍රදානෝත්සවයේදී බෙදා දීමට නොහැකිවී තිබුණි.

(ii) මෙම ග්‍රන්ථයෙහි පිටපත් 300 න් පිටපත් 200ක් අමාත්‍යාංශ ප්‍රචර්ධන අංශයෙහි 2022 මාර්තු 31 දින වන විටද පැවතිණි.

4 යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වේ. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරවද ගණන් දීමේ නිලධාරී විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී සහ වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුය.

එසේ වුවද, අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද වසර කීපයක සිට අදාල තනතුර පුරප්පාඩුව පැවතුණි. අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 194 ක් ක්‍රියාත්මකව පැවතියද සංස්කෘතික අංශය සඳහා 2021 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර හා ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණන කටයුතුද ඉටු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 169 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 50 කි. ඒ අතුරින් සහකාර ලේකම් තනතුරු 03 ක සංවර්ධන නිලධාරි තනතුරු 15 ක සංවර්ධන සහකාර තනතුරු 11 ක සහ කළමනාකරණ සහකාර නිලධාරි තනතුරු 8ක පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතුණු අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, කාර්යාල කාර්ය සහායක තනතුරක අතිරික්තයක් පැවතුණි.

(ආ) සංස්කෘතික අංශයේ සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරින් 201 ක් අනුමත කර තිබුණද තත්‍ය සංඛ්‍යාව 133 ක් වූ අතර තනතුරු 68 ක් එනම් සියයට 34 ක් පුරප්පාඩු පැවති අතර සංස්කෘතික අංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 141 ක් වුවද තත්‍ය සංඛ්‍යාව 179 ක් වුයෙන් තනතුරු 38 ක් එනම් සියයට 27 ක අතිරික්තයක් පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය සතුව සංස්කෘතික මධ්‍යස්ථාන 194 ක් පැවතුණද මධ්‍යස්ථාන මුරකරුවන් 306 ක් සේවයේ යොදවා තිබූ අතර 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මුරකරුවන් 114 ක් අනුමත කිරීම හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා වී තිබුණි. විගණනය විසින් සිදුකල පරීක්ෂාවන් අනුව මෙම අතිරික්ත මුරකරුවන් 105 දෙනාගේ සේවය කාර්යක්ෂම අයුරින් ලබා ගැනීමට ද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

එච්.එම්.රණසිංහ බණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 - කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාර සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලා හදාරන සිසුන් ගණන සත්‍ය අගය - 31,407 (සංස්කෘතික මධ්‍යස්ථාන -201) (අපේක්ෂිත අගය - **50,000**) • කොවිඩ් වෛරසය පැතිරීම හේතුවෙන් සිසුන්ගේ සහභාගීත්වය අඩු වීමක් සිදුව ඇත	-	-	62%
2. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල හරහා පුස්තකාල පහසුකම් ලබන ප්‍රාදේශීය පුස්තකාල සාමාජික ගණන සත්‍ය අගය - 38,800 (අපේක්ෂිත අගය - 45,000) • කොවිඩ් වෛරසය හේතුවෙන් අපේක්ෂිත අගයන් සඳහා ලඟාවීමට අපහසු විය	-	86%	-
3. සංස්කෘතික කටයුතු අංශය මගින් වාර්ෂිකව පවත්වන ලද / දායකත්වය ලබාදෙන ලද ජාතික/ විශේෂ වැඩසටහන් ගණන සත්‍ය අගය - 05 (අපේක්ෂිත අගය - 10) • කොවිඩ් වෛරසය හේතුවෙන් අපේක්ෂිත අගයන් සඳහා ලඟාවීමට අපහසු විය	-	-	50%

4. සංස්කෘතික මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශීයව පවත්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් ගණන සත්‍ය අගය -1,164 (අපේක්ෂිත අගය - 2,328) • කොවිඩ් වෛරසය හේතුවෙන් අපේක්ෂිත අගයන් සඳහා ලඟාවීමට අපහසු විය	-	-	50%
5. දීප ව්‍යාප්තව ස්ථාපිත කළ නව සංස්කෘතික මධ්‍යස්ථාන ගණන සත්‍ය අගය -201 (අපේක්ෂිත අගය - 331)	-	-	61%
6. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් පවත්වන ලද විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් ගණන සත්‍ය අගය - 0 (අපේක්ෂිත අගය - 35) * කොවිඩ් වෛරසය හේතුවෙන් අපේක්ෂිත විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් පැවැත්වීමට අපහසු විය	-	-	-
7. ක්‍රියාත්මක සංස්කෘතික ද්විපාර්ශ්වික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් ගණන සත්‍ය අගය - 48 (අපේක්ෂිත අගය -68)	-	-	71%
8. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම (සිංහල හා දමිළ මාධ්‍ය වලින්) සත්‍ය අගය - 2,570 (අපේක්ෂිත අගය -3,000)	-	85%	-

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
4. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සලසා දීම	**4.7.** 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන හා තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය, ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවධත්වය ඇගයීම හා තිරසර සංවර්ධනයට	1. දීප ව්‍යාප්තව ඉදිවන, ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන ගණන		61%	
		2. සංස්කෘතික මධ්‍යස්ථාන හරහා පැවැත්වෙන දේශීය සෞන්දර්යය පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන් සංඛ්‍යාව		62%	
		3. සංස්කෘතික මධ්‍යස්ථානවල ප්‍රාදේශීය පුස්තකාලවලින් බිහිවන පාඨක සංඛ්‍යාව			86%
		4. සංස්කෘතික කටයුතු අංශය මඟින් වාර්ෂිකව දායකත්වය දක්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් සංඛ්‍යාව		50%	

	සංස්කෘතික වශයෙන් දායක වීම ඇතුලත් වේ	5. විදේශ සංස්කෘතික සබඳතා, සංස්කෘතික ද්විපාර්ශ්වික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් මඟින් කලාකරුවන් ලද පුහුණු අවස්ථා සංඛ්‍යාව (කොවිඩ් වෛරසය හේතුවෙන් අපේක්ෂිත විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් පැවැත්වීමට අපහසු විය)		71%	
		6. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා ඉදිරිපත් වූ නිර්මාණ සංඛ්‍යාව			85%
11 නගර හා ජනාවාස, පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීම	**11.4.** ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	1. ශිල්ප ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම • හාලි ඇළ සංචාරක ප්‍රවර්ධන ශිල්ප ගම්මානය		82%	

		2 සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳව එළිදක්වන ලද පර්යේෂණ වාර්තා සංඛ්‍යාව (කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත මට්ටමට ලභාවීමට නොහැකි විය)			මූලික කටයුතු ආරම්භ කර ඇත.
		3 ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම. • අස්පෘෂ්‍ය උරුම සංරක්ෂණය පිළිබඳ යෝජනාවක් යුනෙස්කෝ සංගමය වෙත ඉදිරිපත් කිරීම			100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ජයග්‍රහණ

1. ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම.
2. ශිල්ප ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

3. කොවිඩ් 19 වසංගත තත්වය යටතේ වුවද 2020 අන්තර් රාජ්‍ය සේවක සහ විශ්‍රාම රාජ්‍ය සේවක නිලධාරී නිර්මාණ තරඟාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය රු.මි.4.95 ක වියදමින් මරදාන එල්ෆින්ස්ටන් රංග ශාලාවේදී පැවැත්වීම
4. අලුතින් ඉදි කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන 6ක් වන දොඩංගොඩ, මදුරාවල, පාලින්දනුවර (බදුරලිය), බුලත්සිංහල, ගොඩකවෙල, ඉඹුල්පේ හා ඇල්ල සංස්කෘතික මධ්‍යස්ථාන ජනතා අයිතියට පත් කිරීම
5. 73 වන ජාතික නිදහස් දින උළෙලේ සංස්කෘතික අංගය සඳහා යාපනය, මහරගම, කැස්බෑව, කඩුවෙල හා පාදුක්ක යන සංස්කෘතික මධ්‍යස්ථාන 5හි ශිල්පීන් 100ක් සහභාගී කරගැනීම.
6. කොවිඩ් 19 වසංගත තත්වය යටතේ සංචාරක කර්මාන්තය බිඳවැටී ඇති පසුබිමක සංස්කෘතික හුවමාරු වැඩසටහන් අරමුණු කරගනිමින් අමාත්‍යාංශ ලේකම්තුමා විසින් නෙදර්ලන්තය හා ඉතාලිය යන රටවල තානාපතිවරුන් සමග සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය පිළිබඳ සාකච්ඡාව පැවැත්වීම.

<u>අභියෝග</u>

1. කොවිඩ් 19 වසංගත තත්වය යටතේ වුවද පාඨමාලා ක්‍රියාත්මක කරමින් දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන 194ක් සක්‍රීය ලෙස පවත්වා ගැනීම .
2. 2022 වසරේ පැවැත්වීමට නියමිත “Cultural Saubhagya” සංස්කෘතික ප්‍රසංගයට අදාළ මූලික කටයුතු ආරම්භ කිරීම හා ජාතික නර්තන සංචිතයේ ශිල්පීන් 100ක් “අපේගම” පරිශ්‍රයේ දී එම ප්‍රසංගයේ පුහුණුවීම් කටයුතු ආරම්භ කිරීම.
3. කොවිඩ් 19 වසංගත තත්වය යටතේ වුවද දිවයිනේ විවිධ පළාත්හි ක්‍රියාත්මක පෙරහැර වැඩසටහන් සඳහා නර්තන කණ්ඩායම් සහ ප්‍රතිපාදන සැපයීම. මේ යටතේ මහනුවර දළදා මාළිගාවේ පෙරහැර සඳහා මූල්‍ය දායකත්වය දැක්වීමත් හුණුපිටිය ගංගාරාම පෙරහැර සඳහා නර්තන කණ්ඩායම් සැපයීමත් සිදු කරන ලදී.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	17	12	05
තෘතීයික	02	01	01
ද්විතියික	589	501	88
ප්‍රාථමික	435	416	19

6.2 මානව සම්පත් හිඟය හේතුවෙන් ආයතනයේ කාර්යයන් බලාපොරොත්තු වන අයුරින් වේගවත්ව හා සඵලදායී ලෙස ඉටු කිරීමට හැකියාවක් නොමැත. එබැවින් ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීමට අපහසුවේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
1. මනෝවිද්‍යා උපදේශන වැඩමුළුව	100	පැය 3	106,850.50		දේශීය (අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයේ නිළධාරීන්)	අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ මානසික ආතතිය අවම කිරීමට හා යහපත් මානසික සෞඛ්‍ය තත්වයක් යටතේ නිරවුල්ව පවුල් ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් හා දැනුම ලබා දීම. (ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශක වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන මහතාගේ මූලිකත්වයෙන්)
2. රසවින්දන වැඩසටහන	100	පැය 3			දේශීය (අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයේ නිළධාරාන්)	සේවකයින්ගේ මානසික පීඩනය අවම වීම මෙන්ම සුහදතාවය වර්ධනය වීම, කලා කුසලතාවන් එලිදැක්වීමට අවස්ථාව හිමි වීම.
3. රසවින්දන වැඩසටහන	100	පැය 3	161,515.00		දේශීය (අමාත්‍යාංශ	සාහිත්‍ය රසාස්වාදය

					යේ සංස්කෘතික අංශයේ නිළධාරීන්)	ඔස්සේ සේවකයින්ගේ මානසික පීඩනය අවම වීම (ප්‍රවීණ සාහිත්‍ය විචාරක මහින්ද ප්‍රසාද් මස්ඉබුල මහතාගේ මුලිකත්වයෙන්)
4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම පිළිබඳ තෙදින වැඩසටහන	35	දින 3	304,887.23		දේශීය (අමාත්‍යාංශයෙහි හා අනුබද්ධිත දෙපාර්තමේන්තු හා අනුබද්ධ ආයතනවල නිලධාරීන්)	නිළධාරීන් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඇතිවී තිබූ ගැටළු නිරාකරණය වීම හා පොදු ආකෘතියක් යටතේ අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය මූලික පසුබිම සැකසීමට හැකි වීම (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපදේශකත්ව යෙන්)

පුහුණු වැඩසටහන් මගින් නිලධාරීන් දැනුවත් කිරීම් හා ඔවුන් ලබන අත්දැකීම් රාජකාරි කටයුතු සඳහා උපයෝගී කර ගැනීමෙන් ආයතනයේ කාර්ය සාධනය වැඩිදියුණු කර ගත හැකිය.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අමාත්‍යාංශය යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් හැර වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වනු නොලැබේ.	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		-
1.6	වෙනත්	අනුකූල නොවේ		-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩිපත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.5	සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරියන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන සිමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ	-	-
	සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම	අනුකූල වේ	-	-
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම අනතුරක් සම්බන්ධයෙන්ම මු.රේ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල් බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම			
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූලවීම	අනුකූල වේ	-	-
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන්	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
			අයකරගැනීමට කටයුතු කරමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව,	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම			
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 2017/04 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ		අනාගතයේදී වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට කටයුතු යොදමින් සිටී
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක (1) 05/2018 හා 05/2008දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	-	ඉදිරියේදී මේ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරයි
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	-	ඉදිරියේදී මේ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරයි
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2021

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය.

මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට හා වේදිකා නාට්‍ය සංදර්ශන සඳහා අනුමැතිය ලබා දීම ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ මූලික කාර්යය බව එහි **මුල්ම ආඥා පනත වන1912** අංක 07 දරණ ප්‍රසිද්ධ රඟුම් ආඥා පනතෙහි (Public Performance Ordinance) සඳහන්ව ඇත.

එසේම ආරම්භයේදී මෙම පනතෙන් ආවරණය වූ විෂය ක්ෂේත්‍රය වඩා පුළුල් විය. එනම් සැණකෙළි (Carnivals) චිත්‍රපට (Cinema) හා සමාජ ශාලා (Clubs) යන ක්ෂේත්‍රයන් ද එහි බලාධිකාරයට යටත් විය.

1912 ආඥා පනත 1918, 1919 යන වර්ෂයන්හිදී සංශෝධනය කරන ලද අතර **ස්ථිර රඟුම් පාලක මණ්ඩලයක් ස්ථාපනය කෙරෙනුයේ 1952 අංක 23 දරණ ආඥා පනතිනි.**

1956 සංස්කරණයක් සිදුවූ අතර වර්ෂ 1961 (අංක41), 1964 (අංක26), 1969 (අංක11) සංශෝධනයන් සිදුකර ඇත. මුල් ආඥා පනත ප්‍රසිද්ධ රඟුම් සඳහා පමණක් සීමා වූ පනතක් බවට පත්වූයේ 1961 සංශෝධන අනුවය.

ආරක්ෂක කටයුතු විෂය භාර අමාත්‍යවරයා යටතේ තිබූ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය 1989 දී අධ්‍යාපන සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරුණි. 2004 දී එය ක්‍රියාත්මක වූයේ සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙන්ය. වර්ෂ 2015 සිට එය අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත් වී තිබූ අතර 2019 වර්ෂයේ නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත්ව පැවතිණ. 2019 අග භාගයේ සිට බුද්ධ ශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් පාලනය වේ.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සාමාජික මහත්ම/මහත්මීන්ගේ වගකීම වනුයේ ලංකාව තුළ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට,වේදිකා නාට්‍ය ,සංදර්ශන සමීක්ෂණය කර අනුමැතිය ලබා දීමයි.

පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය 1983 දී 25 දක්වා වැඩි කල අතර 1997 සේනක බණ්ඩාරනායක කමිටු වාර්තාව අනුව එහි සාමාජිකයන් ගණන 15 කට සීමා කල යුතු බවට යෝජනා කෙරිණි. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය ඉහලම බලාධිකාරිය යටතේ ප්‍රතිෂ්ඨාපනය කල යුතු අතර එහි විෂය ක්ෂේත්‍රය රූපවාහිණි මාධ්‍ය හා වීඩියෝ කර්මාන්තයද අනාවරණය වන පරිදි පුළුල් විය යුතු බවට වැඩි දුරටත් යෝජනා කෙරිණ

සභාපතිනියගේ සමාලෝචනය.

මණ්ඩලයේ වගකීම වනුයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇති යෝජිත ප්‍රදර්ශන මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු තත්වයේ පවතින්නේදැයි පරීක්ෂා කිරීමයි. මහජන ප්‍රදර්ශනයට සුදුසු නොවීමට නොයෙක් හේතු සහ සාධක තිබිය හැක. විශේෂයෙන් එය අපගේ,

සංස්කෘතියට ගැලපේද?

නීතියට අනුකූලවේද?

සාමයට තර්ජනයක් විය හැකිද?

ජාතික සමඟියට හානියක් විය හැකිද?

යනාදි කරුණු අදාල වේ. මෙහිදී මණ්ඩල සාමාජිකයන් ගේ පුද්ගලික මත මනාප වෙනුවට පිළිගත් සම්මත වූ මිණුම් භාවිතා වේ.

දැනට අනුමැතිය සඳහා ඉදිරිපත් වන ප්‍රදර්ශන සංඛ්‍යාව සහ එම ප්‍රදර්ශනයන්හි අඩංගු විෂය පථයන් මෙන්ම සිංහල, දෙමළ, ඉංග්‍රීසි , හින්දි සහ වෙනත් භාෂාවන් යොදා ඇති චිත්‍රපට ප්‍රදර්ශන වීමෙන් සහ මණ්ඩලයේ සාමාජිකත්වය පුළුල් කිරීම මඟින් එහි කාර්ය භාරය ඉහල නැංවිය හැකිය. එමඟින් ලාංකීය චිත්‍රපට කර්මාන්තයට හා නරඹන්නන්ට නව ජීවයක් ලබා දිය හැක.

මෙතෙක් නොතිබුන මණ්ඩලයටම අයත් චිත්‍රපට ශාලාවක අඩුපාඩුව මෑතකදී සම්පූර්ණ කර ඇත. එමගින් ද මණ්ඩලයේ කාර්ය භාරය පහසු කර ඵලදායී කොට ඇත.

කාර්ය මණ්ඩලය

අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	ක.සේ.ව.අංක 03/2016 අනුව වැටුප් ක්‍රේතය	අනුමත තනතුරු සංඛ්‍යාව
01	ලේකම්	JM 1-1	01
02	වැඩසටහන් නිලධාරී	MA 3	04
03	තොරතුරු තාක්ෂණ සහායක	MA2-1	01
04	කළමනාකරණ සහකාර	MA1-2	01
05	රියදුරු	PL3	02
06	ප්‍රක්ෂේපණ යන්ත්‍ර ක්‍රියාකරු	PL2	01
07	කාර්යාල කාර්ය සහායක	PL1	01
		එකතුව	**11**

ප්‍රසිද්ධ රැකුම් පාලක මණ්ඩලය සඳහා 2018.10.22 දින කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් පහත තනතුරු අනුමත කර දී ඇත.

වර්තමාන කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	අදාළ වන සේවය	වැටුප් ක්‍රමය	**2020.12.31** දිනට සිටි සේවක සංඛ්‍යාව
1.	සභාපති		දිමනා	1
2.	ලේකම්	සංවර්ධන නිලධාරී තනතුරින් මෙය ආවර්ණය කරනු ලබයි	දිමනා	1
3.	සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය II	MN4-2006	3
4.	රියදුරු	රියදුරු සේවය	PLI-2006	0
5.	කාර්යාල කාර්ය සහයක	කා.කා.සේ I/II/III	PLI-2006	1
			එකතුව	**6**

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සමාජ වගකීම.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය චිත්‍රපට,නාට්‍ය, සහ සංදර්ශන සඳහා මහජන ප්‍රදර්ශනයට අනුමැතිය දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලබන අතර අවශ්‍ය සංශෝධන යෝජනා කරනු ලබයි.
මහජන ප්‍රදර්ශනය සඳහා අනුමත කිරීමේදී හෝ වාරණයට ලක් කිරීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති කෙරෙහි ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සැලකිළිමත් වී අනුමැතිය ලබා දෙමින් බලවත් වගකීමක් ඉටු කරයි.

1. රටේ පවතින නීතිය හෑල්ලුවට ලක් නොකළ යුතුය.
2. සියලුම ජාතීන්ගේ සහ වාර්ගිකයින්ගේ සිරිත් විරිත් සහ සම්ප්‍රදායන්ට ගරු කළයුතුය.
3. සියලුම ජනතාවගේ ආගමික හැඟීම් වලට ගරු කළ යුතුය.
4. අපරාධ, සාවද්‍ය ක්‍රියා, දුෂ්ට ක්‍රියාවන් හෝ පාපයන් පිළිබඳව ප්‍රේක්ෂක අනුකම්පා නොයිපදිය යුතුය.
5. විවාහයේ පාරිශුද්ධත්වය පිළිගත යුතු අතර දුශ්චරිතය ඉස්මතුවන ආකාරයට ලිංගිකත්වය ඉදිරිපත් නොකළ යුතුය.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය ඉහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමේදී මානව ප්‍රගතියට කලා ලොවේ පවත්නා වැදගත්ම කලාව රස විඳීම සඳහා ප්‍රේක්ෂකයාට ඇති අයිතියත් සැලකිල්ලට ගනිමින් නිදහස් අදහස් ප්‍රකාශනයට ඇති අයිතිය වැරදි ආකාරයට පාවිච්චි කරන්නේද යන වග ද සිහි තබා ගනී. ඒ සඳහා සමාජ වගකීම මුල් තැනෙහි ලා සැලකිල්ලට ගනු ලැබේ. සමාජයට අහිතකර දේ බැහැර කිරීම, රඟුම් පාලක මණ්ඩලයේ ප්‍රතිපත්තියයි.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ වගකීම කිසියම් චිත්‍රපටයක්, නාට්‍යක් හෝ සංගීත සංදර්ශනයක්, එය මහජන ප්‍රදර්ශනයට සුදුසු විෂයයක්ද යන වග තීරණය කිරීමයි. මේ තීරණයට එළඹීමේදී ඊට නිසි වාරණ සීමා හා වගකීම් අදාළ ප්‍රේක්ෂකයන් වෙත පැනවිය හැකිය. ඉහතින් පැනවූ නීති රෙගුලාසි මණ්ඩලයට පැවරී ඇති බලතල හා කාර්යයන් අනුව ක්‍රියාත්මක වේ.

චලන චිත්‍රය සංනිවේදනය තුළ පවත්නා බලවත්ම මාධ්‍යයයි. ඉන් ප්‍රබල බලපෑමක් චිත්‍රපට ප්‍රේක්ෂකයන් වෙත ඇතිකළ හැකිය. එය ජනතා යහපත සඳහාද මෙහෙයවිය හැකිය.

ඉහත සඳහන් වූ ප්‍රතිපත්ති සලකා බැලීමට අමතරව අදාළ කරුණු ඉදිරිපත් කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම සඳහා පූර්ණ අයිතිය ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සතුය.

වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් සමාජ වගකීම් න්‍යායන් භාවිතාවේ. මෙහිදී විශේෂයෙන් අපරදිග කලාව හුදු නිදහස් කලාවක් වශයෙන් ව්‍යාප්තවීමට තිබෙන නිදහස පෙරදිග රටවල පවතින සමාජ වගකීම යන තීරණාත්මක සාධකයෙන් තුලනය වේ. මෙහිදී සරළ වශයෙන් කියන්නේ නම් මේ කලා නිර්මාණ මහජන ප්‍රදර්ශනයන් බැවින්, සමාජයට ඉන් වන අහිතකර තත්වය සලකා බලා තීරණයන් කෙරෙහි එළඹීම මණ්ඩලයේ මූලික වගකීමකි.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

ඉදිරි දැක්ම

නිදහස් හා යහපත් නිර්මාණ පරිසරයක් ගොඩනැඟීම.

මෙහෙවර

චිත්‍රපට,නාට්‍ය,සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා වර්ගීකරණ සහතික ලබාදීම සහ කලා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

අරමුණ

සමාජ වගකීම නිර්මාණ නිදහස ජනතා සුබසෙත ආදිය පදනම් කරගනිමින් මහජන ප්‍රදර්ශනය සඳහා සංදර්ශන හා කලා නිර්මාණ ඉදිරිපත් කිරීම දිරිමත් කිරීම.

ප්‍රධාන කාර්යයන්

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත.

එහිදි උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කරනු ඇත.


ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය - සංවිධාන සැළැස්ම -2021
ගරු අමාත්‍යතුමා
අමාත්‍යාංශ ලේකම්
අතිරේක ලේකම් (පාලන)
ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සභාපති
සාමාජික මණ්ඩලය -15
ලේකම්
සංවර්ධන නිලධාරි 04
කාර්යාල කාර්යය සහායක 01
රියදුරු -

ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය වසර 10 ක

බලපත්‍ර ගාස්තු ආදායම.

අනු අංකය	වසර	එකතුව (රු . මිලි)
1.	2009	0.59
2.	2010	2.25
3.	2011	2.73
4.	2012	3.00
5.	2013	3.15
6.	2014	4.36
7.	2015	4.04
8.	2016	6.79
9.	2017	9.40
10.	2018	5.76
11.	2019	6.60
12.	2020	2.3
13.	2021	1.9

- ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය අමාත්‍යාංශයේ විගණන ඒකකය මගින් පාලනය කරන අතර, 2021 වර්ෂය සඳහා විගණන විමසුම් නොමැත.

2021 ප්‍රාග්ධන වියදම

වැය විෂය	2021 අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනය	2021 වසරේ වියදම් ප්‍රතිපාදන	සමස්ත වියදම් ප්‍රතිපාදනය
101-1-3-2-2001 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)	5,600,000.00	5,510,000,00	92%
101-1-3-2-2102 (ගෘහභාණ්ඩ සහ කර්යාලයීය උපකරණ)	10,000,000.00	9,500,000.00	
101-1-3-2-2103 (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)	500,000.00	-	
101-1-3-2-2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)	1,700,000.00	1,700,000.00	
එකතුව	**17,800,000.00**	**16,710,000.00**	

ආයතන ප්‍රගතිය
2021 ප්‍රසිද්ධ රඟහළු පාලක මණ්ඩලය

මාසය	නිරීක්ෂණය කළ මුළු චිත්‍රපට ප්‍රමාණය	චිත්‍රපට					Uඇසිමින මහජන ඉදිරි) ශතයට(	A(වැඩිහිටියන්ට වඩාත් සුදුසු)	X(වැඩිහිටියන්ට පමනයි)	වාරණය කළ	නිරීක්ෂණය පසුවට කල් දමන ලද.	නිරීක්ෂණය කළ මුළු නාට්‍ය සිටපත් ප්‍රමාණය	නාට්‍යය										සංදර්ශන	ඩිවිඩි
		සිංහල	දෙමළ	ඉංග්‍රීසි	හින්දි	වෙනත්							සිංහල		දෙමළ		ඉංග්‍රීසි		වෙනත්		වාරණය කළ	වෙනත් තීරණ		
													ඉඩකඩ	දීර්ඝ	ඉඩකඩ	දීර්ඝ	ඉඩකඩ	දීර්ඝ	ඉඩකඩ	දීර්ඝ				
ජනවාරි	13	04	03	05	-	01	11	02	-	-	-	02	-	02	-	-	-	-	-	-	-	-	01	02
පෙබරවාරි	08	01	04	02	01	-	07	-	01	-	-	14	09	05	-	-	-	-	-	-	-	-	-	05
මාර්තු	17	04	04	07	02	-	15	-	02	-	-	18	09	06	02	-	-	01	-	-	-	-	03	08
අප්‍රේල්	04		01	03		-	02	02		-	-	02	01	-	-	-	-	-	-	01	-	-	04	24
මැයි	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ජූනි	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ජූලි	05	-	-	05	-	-	05	-	-	-	-	02	-	01	-	-	-	01	-	-	-	-	04	-
අගෝස්තු	06	02		04	-	-	03	02	01	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	01	06
සැප්තැම්බර්	-	-	-	-	-	-		-		-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ඔක්තෝබර්	07		03	04	-	-	06	-	01	-	-	02	-	01	-	-	-	01	-	-	-	-	-	-
නොවැම්බර්	13	01	03	05	03	01	12	-	01	-	-	07	03	04	-	-	-		-	-	-	-	05	04
දෙසැම්බර්	16	01	06	05	03	01	12	03	01	-	-	30	18	12	-	-	-		-	-	-	-	07	05
මුළු එකතුව	**89**	**13**	**24**	**40**	**09**	**03**	**73**	**09**	**07**	**0**	**0**	**77**	**40**	**31**	**02**	**0**	**0**	**03**	**0**	**01**	**0**	**0**	**25**	**54**

Department of Government Printing